CHRIST'S GOSPEL
CHURCH

# ශ්‍රී ලංකා ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචි සභාව

හැදින්වීම

මෙම අත්පොත සියළුම ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ සියළුම සෙවකයන්ට ක්‍රමානුකූලව, දේව මෙහෙයන්පැවැත්වීමට හා දේව රාජ්‍යයේ සේවය තුළ ක්‍රියා කිරීමට මඟ පෙන්වීමක් දෙනු ලබයි. ශුද්ධ වූ පාවුල්තුමා 1 කොරින්ති 14:40 සියල්ල ඔබිතා ලෙස ද, පිළිවෙලින් කරනු ලැබේවා කියා අපට අවවාද දී ඇත. මෙම පොත ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ සියළුම සභා පාලකයන්, ක්‍රිස්තියානි දේව සේවකයන් තමාගේ සභාවන්වලදී ක්‍රමානුකූලව දේව මෙහෙයන් පැවැත්වීමට උදව් කරනු පිණිස සූදානම් කර ඇත. එම නිසා මෙම අත්පොත, සියළු බ්‍රයිස්ට් ගොස්පල් සභාවන්වල භාවිතා කරන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි.

**දේවගැති ඩබ්.ඒ. ඩී. කිංස්ලි,**

**නිර්මතෘ සහ සභාපති**

**ක්‍රියිස්ට් ගොස්පල් සභාව**

## ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ ඉතිහාසය

ඩබ්. ඒ. ඩී. කිංස්ලි නමින් ප්‍රසිද්ධ වූ සභාපාලක තුමා දකුණු පළාතේ ශ්‍රීලංකා දේශයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සේදවත්ත ග්‍රාමයේ උපත ලැබ අවු : 18 වයසේදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැලවුම්කරු ලෙස හඳුනාගෙන ගැලවීමට පැමිණියහ. ටික කලකට පසු තමා ගැලවීම ලබා සිටීම දෙවිඳුන් උදෙසා ප්‍රමාණවත් නොවන්නේ යයි සිතූ මොහු තමාගේ යෞවන දිවිය ක්‍රිස්තුස් වහන්සේට සම්පූර්ණයෙන්ම පූජා කර සේවයට කැපවන ලදී. කැපවීමෙන් පසු මොහු ශ්‍රී ලංකා සිව් චතුරස්‍ර සුභාරංචි සභාවේ සමාජිකත්වය ලබා 1993-1995 වර්ෂවල ලයිෆ් බයිබල් ආයතනයේ දේවධර්ම ඩිප්ලෝමා උපාධිය හදාරා ශ්‍රී ලංකාවේ උතුරු මැද පලාතේ පොළොන්නරුව

දිස්ත්‍රික්කයට සුභාරංචි ප්‍රකාශකයෙක් ලෙස සිව්චතුරස්‍ර සභාව යටතේ පිටව යන ලදී. මෙම පලාත ඔහුට ඉතා අළුත් හා නුහුරු වුවද, ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය හදවත තුළ පිරී ඇති හෙයින් ඉතාමත් ප්‍රීතියෙන් දේව රාජ්‍යයේ වැඩ ආරම්භ කරන ලදී. මෙම කාලය තුළ ශ්‍රී ලංකාවේ ඉතාම උග්‍ර ලෙස ත්‍රස්තවාදී ගැටළු පැන නැග තිබුණු අතර පොළොන්නරුව ශ්‍රී ලංකා සිතියමේ මායිම් ගම්මාන අතරට වැටී තිබුණි. දිනපතා වෙඩි හඬ බෝම්බ ප්‍රහාර මාධ්‍යයේ මායිම් ගම්මාන වලට වැද අහිංසක ජනයා L.T.T.E ත්‍රස්තවාදීන් මරා දමන යුගයේ නොබියව එම ගම්මානවලට ගොස්දේව ප්‍රේමය එම මිනිසුන්ට බෙදා දීමට කිංස්ලි ඉතා නිර්භීතව ක්‍රියා කළහ. එක අවස්ථාවක මායිම් ගම්මානයක් වන මැණික්දෙහිය ගම්මානයේ සුභාරංචිය ප්‍රකාශ කරමින් සිටියදී අතරතුර එම නිවසට ත්‍රස්තවාදීන් එල්ල කළ මෝටර් බෝම්බයක් වැටීමෙන් එම නිවසේ ස්වාමියා එතනම මිය යන ලදී. කිංස්ලිගේ ජීවිතය එදින රැකුනේ දෙවි සමිඳුන්ට මොහු උදෙසා තිබූ අතර්ස ස්වර්ගික දර්ශනය නිසාමය.

මෙම පරිච්ඡේදය කියවීමෙන් පසු මා ස්වාමීන්වහන්සේගෙන් අසා සිටියේ මෙම පද ම කෙලෙස ගැලපේද යන්නය. එවිට ස්වාමීන් වහන්සේද මට ප්‍රකාශ ක ආබ්‍රහම් මෙන් නුඹද, දැන් නුඹ සිටින සභාවෙන් ඉවත් විය යුතුය යන්නය. එය මට කෙලෙසකවත් කළ නොහැකි කරුණක් විය. මන්ද මා සිව්චතුරස්‍ර සභා පවුලට අතිශයින්ම ප්‍රේම කළහ. එම පවුල මටත් දුලානිටත් ඉතාම ආදරණීය විය. එම පවුල් සෙනෙහස, ආදරය, රැකවරණය හා ආත්මික රැකවරණය තුළින් වෙන්වීම් මටත් දුලානිටත් කිසිසේත් කළ නොහැකි විය. නමුත් අකමැත්තෙන්

වුවද, දේවපාමුල දේව හඬට මම කීකරු විය. එම නිසා 2009,11,15 දින මාද දූලානිද සිව්වතුරස්‍ර සභා පවුලෙන් අයිත් විය. නමුත් ඒ වෙන්වීම මටද දූලානිවද, මාගේ දරුන්වත් දෙදෙනාටද, දරා ගැනීමට ඉතාම අසීරු විය. දෙවිඳුන් උදෙසා සියල්ලම කැපකිරීමට මමද පුලානිද දෙවිඳුන් සමග ගිවිසුමක් ඇති කරගන්නා ලදී. ඉන්පසුව මමද ලානිද, අප සමග එකට අත්වැල් බැදගත් ඩී. එම්. ජයසේන පාලක තුමාද, එක්ව මෙම දෙවිඳුන්ගේ හඬට කීකරුව ගමත් කිරීම අරඹන ලදී. • ෆ්‍රයිස්ට් ගොස්පල් සභාවේ දර්ශනය හා මා දෙවිඳුන්ගේ ලද දර්ශනය ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ අනාගත ගමන් මග 2011 වර්ෂයේ සිට මගේ මුළු සේවා කාලය පොළොවේ වර්ෂ 50 ක් හෝ 48 ක් පමණ වේ. වතු වෙන්නට යන දේත්, දැන් වෙන්නට යන දේත්, මෙලෙස ලියා ඔබ අතට පත් කිරීමට මට ශුද්ධාත්මයාණන්ගෙන් හඬක් හා පෙළඹීමක් ඇත. මෙම දර්ශනය පොළොවේ ඉටු වනු මම දකින බව මාගේ ප්‍රිය සහෝදරයන්ට, මිතුරන්ට, හා දරුවන්ට නියත ලෙස කියමි. මෙම දර්ශනය පොළොවට ඉතාම ආන්දෝලනාත්මක දර්ශනයක් වේ. මන්ද මෙම දර්ශනය ඉතාම වෙනස් එනම් ගඟේ උඩු අතට වතුර ගලා යාම වැනි එනම් උඩුගම් බලා පිහිනීමක් වැනි ගමනකි. අනෙක් අතට මෙම දර්ශනනය කිංස්ලි වැනි දුර්වලයෙක් ලැබීම හා ප්‍රකාශ කිරීම තවත් පුදුමයට කරුණක් වේ.

එම මෙම දර්ශනය ශුද්ධාත්මයාණන්ගේ අභිමුඛයේ ලබා ඇති මුත් ඔබට ප්‍රකාශ කිරීමට මට දෙවියන් වහන්සේගෙන් අවසර තිබුණේ නැත. නමුත් හදිසියේම මට එනම්, 2011/09/21 වෙනි දින සවස 6.30 පමණ ගාබ්‍රියෙල් දූතයා විසින් මෙම අනාගත දර්ශනය ඔබට, සියල්ල ලියා ප්‍රකාශ කරන ලෙස ප්‍රකාශ කරන ලදී. මෙහි දර්ශනය මා ඔබට දැන් මෙසේ ලියා ප්‍රකාශයට පත් කරමි. නමුත් මෙම දර්ශනයේ සමහර දේවල් ඔබට මා නොලියන අතර, එය මාගේ ජීවිතයේ දෙවිඳුන් පමණක් දැනගෙන කරන ක්‍රියා බව මම දනිමි. තවද, මෙම දර්ශනය මා ඔබ අතට දත් ඔබ මෙම දර්ශනයේ කොටස්කරුවෙක් වන පිණිසය. මෙම දර්ශනය ඉටු වන අයුරු මමදැන් ඔබට කියමි. මාගේ දර්ශනයේ නාමය හෙවත් සභාවේ නම් ඉංග්‍රීසි භාෂාවෙන් Church of the Christ gospel නම් වේ. එය සිංහල

භාෂාවෙත් : ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචියේ සභාව වේ. කෙටියෙන් හැඳින්වෙන්නේ '' CGC''' යනුවෙනි. මෙම සභාවට එනම් ක්‍රයිස්ට්

ගොස්පල් සභාවට ලාංඡනයක් ඇත. එනම් "බයිබලය මත කුරුසිය, කුසලාන කප් එක, පූප භාජනය '' වේ.

**සංකේතවලින් අර්ථවත් වන දේ**

**බයිබලය :** ක්‍රයිස්ට් ගොස්පල් සභාව, මුළු ලියවිල්ලම විශ්වාස කරන සභාවකි. එනම් පොත් 66 පිළිගෙන දේව වචනය මත ගොඩනැගීම අවශ්‍ය බව

**කුරුසිය :** දේව පුත්‍රයා ලෙස ලෝකයේ පාපය දෙවිඳුන් මත ලොවට දෙන මිදීම.

**කුසලානය :** සියල්ලන් සුව කරන බව හා ශුද්ධාත්ම බලය

**පූප භාජනය :** ක්‍රිස්තුස් වහන්සේ තුළින් සියල්ලන්ටම දෙවියන් වහන්සේ

වෙතට සහභාගිකම හා ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසි පූජාවෙන් මුළු ලෝකයාට ලැබෙන මිදීම.

සභාවට තේමාවක් ඇත. ***"නුඹලා ගොස් සියළු ජාතීන් ගෝලයින් කරපල්ලා" - මතෙව් 28:19***

"Therefore, go and make disciples of all nations" Matthew 28.19

ක්‍රයිස්ට් ගොස්පල් සභාවට ඉලක්කයක් ඇත. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් දසයෙන් කොටස දිනීම සභාවේ

ඉලක්කය වේ. දැනට අපි එය මිලියන 2 ක් ලෙස නම් කොට ඇත. එනම් ලක්ෂ 20 වේ. මෙම සංඛ්‍යාව අනාගතයේ වෙනස් වේ. මන්ද දැනට ලංකාවේ ජනගහනය කෝටි දෙකකි. මෙම දර්ශනය සඳහා ක්‍රියා සැලැස්මවල් කිහිපයක් වේ. නමුත් මා මෙම දර්ශනය දකින්නේ වර්ෂ 50 කාලයක් සඳහාය. මෙම දර්ශනය ඉටු වනු සමහර විට ඔබ අතර සමහර අයට දැකීමට නුපුළුවන් බව මම දනිමි. සමහරු මෙය සියයට 10. සමහරු 20. සමහරු 30, සමහරු 40 - 50 සමහරු 70-80 දකිනු ඇත. නමුත් ඔබ අතරේ කුමන ලෙස මෙය දැක්කද මේ කාලයේ දෙවිඳුන් මහිමාන්විත දේදේ කරන බව මම දකිමි. මෙම දර්ශනය ඉටු වන අයුරු මම දැත් ඔබ වෙතට ගෙනෙමි. මෙම දර්ශනය ඔබ බලා ඉටුවෙනු ඇදහිල්ලෙන් දකින ලෙස මා ආරාධනා කරමි. මන්ද මා මෙම දර්ශනය ඇදහිල්ලෙන් දැක්කා වූ දර්ශනයක් වේ. තවද මා සියල්ල කරන්නේ ඇදහිල්ලෙන්ම බව කියමි. ඔබ මා අතේ පොතක් තිබෙනවා දැක එය පොතක්මයි කියා ප්‍රකාශ කරන්නේ නම් එය ඇදහිල්ල නොවේ. ඇදහිල්ල යනු මා පිටුපසින් සඟවා ගෙන ඉන්න දේ පොතක් යයි නිසැකවම කීම වේ.

*මාගේ ධෛර්යයේ වදනක්........*

*"ඔබ දිළිඳුකමේදී පොහොසත්ව සිටින්න. කාන්තාරයේදී*

*වර්ධනය වන්න. පීඩනය තුළ ඵල දරන්න, සිර ගෙදරදී*

*ප්‍රීතියෙන් ගීගයන්න" - කිංස්ලි*

**අනාගතයේ ක්‍රයිස්ට් ගොස්පල් සභාව**

2060 වන විට ප්‍රධාන එඬේරත් 2000ක් මෙම සංවිධානයේ සිටී. 2030 න් පසු ලංකාවේ පාර්ලිමේන්තුවේද 2/4 සිටින්නේ ක්‍රයිස්ට්ගොස්පල් සභාවේ සාමාජිකයන්ය. 2021 විත විට පාර්ලිමේන්තුවේ දෙවිඳුන්ගේ නාමය මහිමයට පැමිණේ. 2028 පසු මම එනම්, කිංස්ලි ඇතුළු තවත් පාලකයන් පාර්ලිමේන්තුවේද ක්‍රිස්තුස්වහන්සේගේ නාමය ද කතා කරයි. 2021 න් පසු ලංකාවේ ප්‍රාප්‍රාදේශිය සභා, පළාත් සභා, නගර සභා සහ පාර්ලිමේන්තුව දක්වා දේව දරුවන් ගමන් කරයි. එයින් බොහෝ අය සිටින්නේ ක්‍රයිස්ට් ගොස්පල් සභා පවුලේ සාමාජිකයත් ය. 2040 වන විට කයිස්ට් ගොස්පල් සභාව ගැන පාර්ලිමේන්තුවේදී විවාදාත්මකව කථාවේ. සභාව සෑම දිස්ත්‍රික්කයකම, නගරයකම, ගමකම ඇති බවත් එය නතර කිරීමට විවිධ පුද්ගලයන් මගින් යෝජනා වේ. නමුත් සභාව පීඩා හා අර්බුධකාරී වාතාවරණයකට මුහුණ දෙන නමුත් ක්‍රිස්තුස් වහන්සේ නැගිට සභාවට ජය දෙයි. 2048 වන කාලය පමණාදී පාර්ලිමේන්තුව හදිසි කැඳවීම්, අත්හිටුවීම් හා විවාදයන්වලට සභාව මුල් වේ. මේ කාලයේ පාර්ලිමේන්තුව දැන් පවතින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ස්ථානයේ නොවේ. විශාල ලෙස ආගම් සංවිධාන සභාවට විරුද්ධ වුවද, මේ කාලයේ පාර්ලිමේන්තුවේ (1/4) -(1/2) වඩා දේව දරුවන් සිටිනු ඇත.

අවසානයේ සභාවේ හඬ රජයෙන් පිලිගනී. මන්ද මෙම කාලයේ රාජ්‍ය පාලකයා රහසින් දෙවින් තමස්කාර කරන අතර, විපක්‍ෂය ද දැන් තිබෙන විපක්‍ෂය නොවේ. දම් පාටට හුරු පාටක සලකුණකින් විපක්‍ෂයක් වන අතර විපක්‍ෂයේ බලවතුන්ද සභාවේ සාමාජිකයන් වේ. රටේ පාලකයා රහසිගතව සභාවට උපකාර කරන අතර ඔහු ප්‍රසිද්ධියේ සභාවට සහය නොදක්වයි. නමුත් 2050 වන විට කුයිස්ට් ගොස්පල් සභාවේ තීරණය දේශයේ තීරණය වනු ඇත. මේ කාලයේ ක්‍රයිස්ට් ගොස්පල් ප්‍රධාන ශාඛාව නිට්ටඹුව ආසන්නයේ පිහිටා ඇත. මෙම කාර්යාලයේ බොහෝ විට දේශයේ අවශ්‍යතා උදෙසා තීරණ ගැනේ.රටේ රාජ්‍ය

නායකයින්නිතරම මෙම ස්ථානයේ රැදී අනුශාසනා ලබනු ඇත.මම මේ සිදුවීම සිදුවනු ඇඳහිල්ලෙන් දකිමි.

මෙම කාලයේ එනම්, 2021 පසු 2050 දක්වා ශ්‍රී ලංකාවේ පොලිස්පති ලෙස දෙවරක්ම පත් වන්නේ ක්‍රයිස්ට් ගොස්පල් සාමාජිකයෙක් වීම දර්ශනයට ද ඉතාම ශක්තියක් වේ. මෙම කාලයේ සභාව මගින් එනම්, සභාව තුළින් පොලිස් දෙපාර්තමේන්තුවට යැවූ අය උසස් තැන්වලට පත් වේ. එය සභාවේ වර්ධනයට ඉතා පිටුවහල් වේ. 2021 - 2053 කාලය තුළ, තුන් වතාවක් අධ්‍යාපන අමාත්‍යවරයා සභාවේ සාමාජිකයෙක් වේ. මේ කාලය තුළ පාසල් ක්ෂේත්‍රය තුල බොහෝ කිතුණු දරුවන් ප්‍රධාන අසුත් වැල සභාව මගින් වාඩි කෙරේ. 2021 න් පසුව ලංකාවේ පාසල්වල කතෝලික විෂයට තිබුණු ස්ථානය කිතුණු විෂයට ලැබේ. මෙම කාලය තුළ අප සභාව මගින් බොහෝ කිතුණු ගුරුවරු පුහුණු කර යැවිය යුතුය. මන්ද පාසල තුළදීම ක්‍රිස්තුස් වහන්සේට ගෝලයන් වීමේ අවශ්‍යතාවයට අප මග පෙන්විය යුතුය. 2025 න් පසු ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල වෙනසක් වේ.

සැම ගමකටම ඇති ග්‍රාමීය රෝහල් වැහෙනු ඇත. එය රජය විසින් සිදු කරයි. නගරයේ ඇති ප්‍රධාන රෝහල් පමණක් ඉතිරි වේ. නමුත් එම ප්‍රධාන රෝහල්වලද ප්‍රතිකාර ලැබීමට රෝගියා භාගයක් මුදල් ගෙවිය යුතුවේ. එම නිසා සැම ගමකම පෞද්ගලික බෙහෙත් සාප්පු ඇති වේ. මෙම ස්ථානවල වෛද්‍යවරු රජයේ විශ්ව විද්‍යාලවල අය නොවේ. මන්ද රජයේ වෛද්‍ය විද්‍යාල සීමා වේ. මෙම කාලයේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල බිහි වේ. මෙම විද්‍යාල වලට අප අපගේ දරුවන් යවනු ඇත. ඔවුන් ඉගෙන ගෙන සැම ගමකම පෞද්ගලික රෝහල්වල වැඩි කරනු ඇත. සමහර දේවදරුවන් පුද්ගලික රෝහල් පවත්වාගෙන යනු ඇත. එම ස්ථාන කරා එන විශාල සෙනගකට සුභාරංචිය මෙම ස්ථානවලදීම අසන්නට ලැබේ. පොලිස් ස්ථානවලද ප්‍රධාන වගකිව යුත්තන් දේව දරුවන් වී සිටින නිසා මෙම න කථා එන සියළුම වැරදි කරුවන්ට මෙම ස්ථානයෙන් සුභාරංචි ඇසීමට අවස්ථාව හිමි වේ. 8

මේ කාලයේදී එනම් 2031 පසුව ශ්‍රී ලංකාවේ විශාල ආත්මික ප්‍රබෝධයක් හට ගනී. විශාල සුභාරංචි රැලි පැවැත්වේ. මනුෂ්‍යයන් දවසකට දහස් ගණන් ක්‍රිස්තුස් වහන්සේ වෙතට ලගා වේ. මේ කාලයේ ක්‍රයිස්ට් ගොස්පල් සභාව තුළ යම් ප්‍රශ්න කිහිපයක් මතු වේ. එනම් 2031 පසු සමහර පාලකයන් සභාවෙන් වෙන් වේ. නව නායකයන් සභාවේ වගකීම් දරයි. නමුත් ක්‍රිස්තුස් වහන්සේ සභාවේ හිසව

සිටිමින් සියල්ලෙන් සභාවට ජය දෙයි. 2025 පසුව ක්‍රයිස්ට් ගොස්පල් යනු ලංකාවේ ප්‍රධාන සභාවන් අතර මූලිකම සභාවක් වේ. මේ කාලයේදී එනම් 2025 - 2048 වන විට ලංකාවේ හතර කොනේම බයිබල් විද්‍යාල හතරම සාදා අවසන්ය. අප ළමා නිවාස නමින් නිවාස සාදන්නේ නැත. "අපේ ගෙදර" කියා අප දරුවන් බලා ගන්නා නිවාස හතර අප 2048 වන විට සාදා අවසන්ය. මේ කාලය වන විට එනම්, 2050 වන විට අප වැඩිහිටි නිවාස දෙකද සාදා අවසන්ය. 2021 වන විට එක් වැඩි හිටි නිවසක් අවසන් කොට තිබේ. 2045 වන විට සභාවේ සමාජිකත්වය ලක්‍ෂ 06 ඉක්ම වන අතර එතනින් පසුව වේගයෙන් සුභාරංචිය ක්‍රිස්තුස් වහන්සේ විසින්ම ගෙන යයි. මේ කාලයේ සභාවේ නාමය ලෝකයේ බොහෝ රටවල ගොස් ඇත. නිතරම් මිෂනාරිවරු ලංකාවට පැමිණි අපගේ දර්ශනයට උපකාරි කරයි. තවද ලංකාවේ සිට ද අපගේ මිෂනාරිවරු බොහෝ රටවලට ගොස් සිටී. බොහෝ අප පාලකයන් විදේශ රට වලට ගොස් ස්වාමීන් වහන්සේ අප දේශයේ බලවත් ක්‍රියා බෙදා ගනු ලබයි. මෙම කාලයේ ශ්‍රී ලංකාවේ ප්‍රධානම ව්‍යාපාර සමාගම්වල අයිතිකරුවන් සභාවේ සාමාජිකත්වය උසුලනු ලබයි. ඔවුන් මෙම දර්ශනය ඉටු කිරීමට බොහෝ උපකාරී කරනු ඇත. 2048 පසු ලංකාවේ ක්‍රයිස්ට් ගොස්පල් සභාව සියළු සභාවන් වලින් ගෞරවය ලබයි. නමුත් පටන් ගැන්මේ සිට සභාව සැම නිකායම ප්‍රතික්ෂේප කරනු ලබයි. නමුත් අප නොබියව ඉදිරියට යනු ඇත. 2055 කාලයේ සභාවේ විශාල වර්ධනයක් තිබේ. එනම් බොහෝ විට මෙම කාලය ශ්‍රී ලංකාවේ රාජ්‍යය පාලකයාද බොහෝවිට අප සභාවේ සමාජිකයෙක් විය හැක. මට එවැනි ඇදහිල්ලක් ඇත. **පිටුව 9**

නමුත් 2050 පසු මම ලංකාවේ රාජ්‍ය පාලකයින්ට නිළ අනුශාසස්තා කරනු ඇත. මාත් සමග තවත් පාලකයන් සිටිනු මට පෙනේ. 2030 ත් පසු අප සභාවේ මහ සභා සම්මේලන හා තරුණ සම්මේලන පවත්වන්නේ පළාත් වශයෙනි. මන්ද එයට හේතුව මා දකින්නේ සභාවේ වර්ධනය නිසා එක් තැනක රැස්විය නොහැක. 2042 න් පසු එය දිස්ත්‍රික්ක වශයෙන් රැස් වේ. මෙලෙස විශාල නායකත්වයක් බිහි වේ. දැනට අප සභාවේ ඇති පාලන ක්‍රමය විශාල ලෙස 2021 පසු වෙනස් වේ. මෙම කාලයේදී විශාල ලෙස සභාවේ නායකත්වයට එකිනෙකා අතර තරග හට ගනියි. නමුත් සභාව ක්‍රිස්තුස් වහන්සේ විසින් වර්ධනය කරා ගෙන යයි. 2011 - 2021 කාලය තරමක් සභාව මන්දගාමීව දේශයට ගමන් කරයි. මෙම කාලය තුළ සභාව දිස්ත්‍රික් 25 ටම ගමන් කරන අතර කිසිවෙක්ගේ බලපෑමක් එතරම් නොවේ. නමුත් සභාව දර්ශනයට සූදානම් වන්නේ මේ කාලයේය. මෙම කාලයේ විශාල වෙනස්වීම් කිහිපයක් හට ගනියි. නමුත් එම

වෙනස්වීම් එළිදරව් කිරීමට මට අවසර නැති බව ප්‍රකාශ කරමි. 2021 වන තෙක් මා තුයිස්ට් ගොස්පල් සභාවේ නිළවරණයකට ඇතුල් නොවේ. මා නිළවරණයකට ඇතුල් වන්නේ 2021 අගෝස්තු 19 දින මහ සභා සම්මේලනය තුලිනි. මේ කාලය තුළ මගේ ජීවිතයේ ඔබට සිතා ගන්නට බැරි වෙනස් වීම් සිදු වී ඇත. විශාල වේදනා, තනිවීම් හා නව මගවල් වෙත මා ශුද්ධාත්මයාණන් ගෙන යයි. නව මුහුණුවරකින් නව උපතකින් මම 2021 ක්‍රයිස්ට් ගොස්පල් සභාවට නායකත්වය දෙනු ලබයි. 2021 න් පසු බොහෝ විට මා දර්ශනය උදෙසා දේශයෙන් පිටවී සිටියි. මා සමඟ මගේ භාර්යාවද මා ළගින්ම සිට මට විශාල උපකාරයක් ගෙනෙනු ඇත. මේ කාලයේ තිරිද කුයිස්ට් ගොස්පල් දර්ශනයට කැප වේ. තවත් කුඩා දරුවෙක් මා මෙම දර්ශනයට පුහුණු කරනු ඇත. එම දරුවා සමහර විට තවම මේ ලෝකයට පැමිණ නැති වන්නට පුළුවන. සමහර විට දැ ඉපදී සිටින්නට පුළුවන, මම එවැනි පිරිමි දරුවකු විශාල සේවයක් කරනු හා විශාල නායකත්වයක් දෙනු ලබන බව දර්ශනයකින් දැක ඇත. එම මුහුණ මට නිතරම මැවී පෙනේ. මම ඒ මුහුණ කොහේ දැක්කොත් හඳුනාගත හැකිය. පිටුව 10

මේ කාලය වන විට එනම්, ශෙහාරා ලංකාවෙන් පිට අධ්‍යාපනය හදාරනු ඇත. 2035 වන විට ශෙහාරා වෛද්‍යවරියකි. ඇයද විශාල ලෙස මෙම දර්ශනය ඉටු කරනු මම දකිමි. මේ කාලයේ මගේ භාර්යාව විශාල ලෙස කාන්තාවන්ට සේවයක් කරන අතර ළමා නිවාස උදෙසා විශාල ලෙස කැපව සිටිනු පෙනේ. මම නිතරම මගේ භාර්යාව සමග එකට ගමන් කරමින් බොහෝ දේශයන් තුළද අප සභාව ගෙන යනු ලබයි. මෙම සේවය අප කරනු ලබන්නේ 2021 න් පසුවය. නමුත් 2021වන තෙක් ශුද්ධව දෙවිඳුන්ට වෙත්වී සිටීම ශුද්ධාත්මයාණන් අයපත් බලපොරොත්තු වේ. එම නිසා මෙම කාලයට **"ශුද්ධකමේ දස වසර"** ලෙස මම නම් තබා ඇත. (2021) පසු මේ කාලයේ බොහෝ අය මගේ භාර්යාව පිළි නොගන්නා අතර පසුව ඉතාම උසස් කොට ගෞරව කරනු ඇත. නමුත් ඉතා ඉවසිල්ලෙන් හා ප්‍රේමයෙන් මා දරා ගත යුතු බව දර්ශනයකින් පෙනේ. මේ කාලයේ අප පවුල් ජීවිතයට ද විශාල නැවුම් බවක් හා ප්‍රීතියක් ගෙනෙනු ඇත. මන්ද, ක්‍රිස්තුස් වහන්සේ මේ කාලයේ අප පවුලේ සිහින සැබෑකරනු ඇත. තිරි, ශෙහාරා ද ඉතා ප්‍රීතියෙන් සිටින කාලයක් බව මම දර්ශනයෙන් දකිමි. මා දකින මෙම දර්ශනයේ තව බොහෝ දෑ ඇතත් ප්‍රකාශ කරන්නට තවම කාලයවත් අවසරයවත් මට නැත. ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ කාන්තා සේවය ඉතාම විශාල අභියෝගාත්මක සේවාවක් වේ. එයට ප්‍රධාන හේතුව මගේ භාර්යාව 2021 න්

පසුව ස්වර්ගික දර්ශනයකින් කාන්තා සේවයක් ඇරඹීම කරනු ඇත. එම සේවය මුලදී පිළි නොගත්තත්, පසුව ශ්‍රී ලංකාවටම විශාල අභියෝගයක් මෙම සේවය මගින් අප සභාව කරනු ලබයි. 2021 න් පසුව මගේ භාර්යාවට බොහෝ දේ අළුත් වන අතර මුලදී යම් අර්බුද හට ගනී. නමුත් පසුව ඇය ඉතා සාර්ථකව සේවය කරනු ලබයි. සමහර දිනවල මම ලංකාවේ නැති අවස්ථාවල මා වෙනුවෙන් නායක මණ්ඩලයට ද මගේ භාර්යාව සහභාගී වේ. මා එය දර්ශනයෙන් දකිමි. පිටුව 11

2060 වන විට අප ලංකාවේ ලක්ෂ 20 දිනා අවසන්ය. මේ වන විට අප අතර දැන් සිටින අය ස්වාමීන් වහන්සේ වෙතට ගොස්ය. සමහර අය ඒත් ජීවතුන් අතරය. නමුත් අප මෙම දර්ශනය දිනනු ඇත. මන්ද මෙම දර්ශනයේ නියමුවා මම නොව ක්‍රිස්තුස් වහන්සේය. එම නිසා ක්‍රිස්තුස්වහන්සේ මෙම දර්ශනය පටන් ගත් ලෙස ම අවසන් කරනු ඇත. මා ප්‍රිය මිතුර මා මේ දර්ශනය සමග නැගිටිමි, දර්ශනය සමඟ නිදියමි. දර්ශනය නිසාමි කමි. තොකාද ඉමි. කතා කරමි. නිහඬ වෙමි. මේ දර්ශනය ඉටු වීමට ඒ දෙස බලා නොසිට මම එයට කැප වෙමි. ඒ උදෙසා වෙහෙසෙමි. කල්පනා කරමි. නිරාහාරව යාච්ඤා කරමි. දර්ශනය උදෙසා සිහින මවා ගනිමි. දර්ශනය ඉටු වනු මට සිහිනයෙන් පෙනේ. මම ඇස් පියා ගන්නා සම විටම මෙම දර්ශනය ඉටු වන අයුරු ඉටු වී ඇති අයුරු දකිමි. දානියෙල් මෙන් සිතමි. එලෙස සිටිමි. දානියෙල් රජවරු තිදෙනෙක් මැරෙන තුරු අනාගතය වාක්‍ය කියා ඇත. නෙබුකනේ සර්, බෙල්ටිල්ශෙකර්. පරියුස් ඔහු ඒ තිදෙනාටම අනුශාසනා දී ඇත. නමුත් දානියෙල් වහලෙකි. තමාගේ රටෙන් පිටව සිටි සරණාගතයෙකි. එතරම් උගතෙක් නොවීය. නමුත් ඔහු තරම් දෙව රහස් එළි කළ කෙනෙක් මට බයිබලයේ මුණ නොගැසේ. ඔහු අරුම පුදුම මිනිසෙකි. ස්වර්ගයේ රහස් එළි කළ මිනිසෙකි. අනාගතයේ එනම් ලෝකයේ අන්තිමය දක්වා කාල වකවානු සමග ලොවට රහස් කියූ කෙනෙකි. වරක් නෙබුකත්නේස්සර් ඔහු බලෝනියේ ප්‍රධාන අනාගත වාක්‍ය හා දිවැසි වරයා හා රජුගේ ප්‍රධාන අනුශාසකයා කර ගත්හ. දාරියුස් රජුගේ කාලයේ රජට බිම් කවලම් කඳු අතර පසුව ප්‍රධාන අමාත්‍යවරයා විය. බෙල්ට්ශෙකර් රජජ්ට ඔහු තුන් වන ආණ්ඩුකාරවරයා විය. එනම්, සාමාන්‍ය වහලෙක් වූ දානියෙල්ය. ඔහු ඔහුට උපතින් ලැබුණු උරුමයට අභියෝග කළහ. ළමා කාලයට අභියෝග කළහ. තරුණ කාලයට අභියෝග කළහ. නිතරම දෙවියන් වහන්සේ තුළ උරුමය ලබා ගැනීමට තමාට උරුමව තිබුණු උරුමයට අභියෝග කළහ. සියල්ලන්ගේ මතය වූ ශක්තිය, රූපය හා පෙනුම රැකගැනීමට වූ - පිටුව 12

රජුගේ ආහාර නොකා වතුරත් එළවලුත් කා උඩුගම් බලා පිහිනාදෙවියන් වහන්සේ තුළ ජය ලැබීය. මා දනියෙල්ගේ සියල්ලේ රහස දකින්නේ ඒ ඇදහිල්ලෙන්, සියල්ල වෙනස් කළ මිනිසා ලෙසය. ඒ උදෙසා ඔහු දෙවනුව උපකාරයක් කර ගත්තේ ශුද්ධ ජීවිතය වේ.සිංහ ගුහාවේ කට වැසුවේ රජ වූවත් සිංහයන්ගේ කට වැසුවේදෙවියන් වහන්සේය. මන්ද, දානියෙල් උදෙසා දෙවියන් වහන්සේට ඒදේවල් කරන්නට සිදු විය. මන්ද, දානියෙල් සියල්ල ඇදහිල්ලෙන්වෙනස් කරන නිසා දෙවිඳුන්ගෙන් උපකාර ලැබිණි. ඔහුට දෙවිඳුන්ගේආත්මය ඇතැයි ප්‍රකාශ කරේ සාමාන්‍ය ජනයා නොව උත්තරිතරරාජ්‍ය සභාවය. ඔහුගේ එක වචනයට දෙවියන් වහන්සේ ඇසුම්කම්දුන්නේ දානියෙල් අරුම පුදුම මිනිසෙක් නිසා නොව, ඔහුඇදහිල්ලෙන් සියල්ලට අභියෝග කළ නිසාමය.මා ප්‍රිය මිතුර, විමද එලෙසම සිතමි. මගේ සිතුවිලි ඉතාගැඹුරු බව ඔබට දැත් මේ දර්ශනය කියවන විට වැඩිහෙනු ඇත. මාද දානියෙල් ලෙස මගේ සියළු උරුමය වෙනස් කරමි. මම ද දෙවිඳුත්තුළ මේ ගමන තුළ මේ පොළවේ පුදුම දේවල් කරමි. මොහොතක්සිතන්න. දැනටම මිනිසුන් මා රූපයක් කරගෙන මාවම සොයයි.නමුත් මම ඒ සෑම අවස්ථාවකම මාව පහත් කොට ක්‍රිස්තුස් වහන්සේමහිමයට පමුණුවමි. නමුත් එසේ මිනිසුන් මාව සෙවීම පුදුමයක්නොවේ. එයට හේතුව මම සියල්ලටම ක්‍රිස්තුස් වහන්සේ තුළඅභියෝග කරන නිසාය. මා ප්‍රිය මිතුර, මා ඔබටත් එසේ වන්නටආරාධිතා කරමි. ඔබට දැ මේ පොළවේ විශාල ගමනක් ඇත. නමුත්ඔබ බලා සිටීමෙන් යාච්ඤා කිරීමෙන් පමණක් එය ඉටු නොවේ. ඔබක්‍රියාත්මක වන්න. මෙම ක්‍රියිස්ට් ගොස්පල් දර්ශනයට අවශ්‍ය වන්නේතමාගේ උරුමයට අභියෝග කරන ශුද්ධව ජීවත් වන්න ආසා කරනඅයයි.

මා ප්‍රිය මිතුර මා ඔබට ධෛර්යය ගෙනෙමි. ඔබට දමෙලෙස දෙවිඳුන්ට ලං විය හැකිය. ඔබද රාත්‍රියේ දවාලේ දෙවිඳුන්ගේඅභියස රැඳෙන්න. නිතරම ශුද්ධාත්මයෙන් පූර්ණව සිතන්න.

ඇදහිල්ලෙන් පටන් ගෙන මම ගුරුවරයක් ගාවට ගියේ නැත. නමුත් මට ඕනෑම විදේශිකයෙකුගේ දේශන වැටහේ. එලෙස වුනේ කෙලෙසද? ඇදහිල්ලෙන්ය. කොළඹ, කුරුණෑගල, පොළොන්නරුව. **පිටුව 13**

වැනි ප්‍රධාන ප්‍රදේශවල සභාව ආරම්භ කළේ ඇදගිල්ලෙන්ය. තවත් අයට ඇදහිල්ලෙන් දින වකවානු මා දී ඇත. ඇදහිල්ලෙන් ඒ දෙවල් වන බව දනිමි. වෙලාවට සිංහ ගුහාවේ කට වැසූ පසු කරුවලේ දෙවිඳුන් ක්‍රියාත්මක විය.

දෙවිඳුන් සිංහ ගුහාවේ කට වන තෙක් ක්‍රියා කළේ නැත. සිංහයන්ගේ කට දූතයන් වසනවා දැක්කේ දාතියෙන් පමණි. මමත් එලෙස සමහර ක්‍රියාවන් දෙවිඳුන් හා දූතයන් කරනු දකී. නමුත් එය ලොවට නොපෙනේ. සිංහ ගුහාවට දානියෙල් දමන්නට කලින්ම දූතයා ඇතුලට ගියාද නැත්තම් වැසුවාට පස්සේ ගියාද ඔබට සිතෙනු ඇත. නමුත් මට එලෙස නොසිතේ, මන්ද ඒ දෙකම වුණේ නැත. දානියෙල් තුළ ශුද්ධාත්මයාණන් වැඩ වස්තු නිසා අඳුරු ගුහාවේදී සිංහයන්ගේ කටවසන්නට දෙවිඳුන් පැමිණියේ දානියෙල් තුළ සිටගෙනය. එය රජවත්, ඇමතිවරුන්වත්, සතුරන්වත් නොදනිති. එනිසා දානියෙල්ට උපකාර කිරීමට ඇති දොර ඔවුන්ගේ නුවණේ හැටියට වැඩිය. නමුත් දානියෙල් තුළ ගීත දොරක් වැසීමට හෝ ඇරීමට හැකි ශුද්ධාත්මයාත් සිටින බව ලෝකයා දැන නොසිටින්න ඇත. මා තුළ එලෙසමය. මා කොහේට ගියත් ඔබ නොදත්තා වූ රහස නම්. දෙවිඳුන්ගේ ශුද්ධ ආත්මය මා තුළ වැඩ වසයි. එම නිසා ඕනෑම අඳුරු වතාවරණයක සිටිමින් වැඩ කිරීමට සූදානම් ය. ඕන වලකට වැටීමට ලෑස්තිය. මන්ද මා තුළ ඒ ශුද්ධාත්මයාණන් අවශ්‍ය සෑම මොහොතේ සිට එළියට පැමිණ පරිසරය සූදානම් කරයි.

ඉතින් ප්‍රිය මිතුර, අපි ශක්තිමත්ව නැගිටිමු. මේ දර්ශනය අපට අනිවාර්යයෙන්ම කළ හැක. අප දේශයේ දසයෙන් කොටස දිනනවාමය, නැගිටිමු. එකතු වී ජය ගනිමු.

අප මෙම පොවෙත් යන දවසස්ට ස්වර්ගයේ විශාල උත්සවයක් පවත්වා අපව පිළි ගනු පිණිස පොළොවේ අප යටහත් වී වැඩ කරමු.

ස්තූතියි.

ඔබේ යටහත් පාලක

කිංස්ලි

2011/09/22 14

**ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ ජාතික පාලන ක්‍රමය**

ජාතික නායක පාලක මණ්ඩලය

සභාපති හා පොදු පරිපාලක මණ්ඩලය

⇓

පලාත්/දිස්ත්‍රික් ප්‍රාදේශිය පාලකවරුන්

↓

සභාපාලක/ සහකාර පාලක

↓

ක්‍රිස්තියානි සේවක ස්වෙච්ඡා සේවක

↓

ඇදහිලිවන්තයන්

මේ හැර බයිබල් ආයතනයන් ළමා නිවාස, වැඩිහිටි නිවාස,

වෘත්තීය පුහුණු ආයතන, දර්ශනය උදෙසා ගොඩනගනු ලබයි. තවද

පුරුෂ සංගම්, තරුණ සංගම්, ළමා සංගම්, වශයෙන්ද ගොඩ නගනු ඇත. මෙම සැම අංශයකටම උදව් කරනු පිණිස ප්‍රාදේශිය පළාත් හා දිස්ත්‍රික්ක මට්ටමෙන් නායක මණ්ඩලය විසින් තෝරා පත් කරනු ඇත.

නායකත්වය ඇති කරන්නේ දෙවියන් වහන්සේ නිසා අප එයට කීකරු විය යුතු යැයි කයිස්ට් ගොස්පල් සභාව විශ්වාස කරයි.

හේබ්‍රෙව් 13:17

**මිශනාරි දීමනාවන්**

ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්තව ඇති සියළුම ක්‍රයිස්ට් ගොස්පල් ප්‍රධාන සභාවන්, අනුසභාවන් හා ගෘහ සභාවන් සැම මසකම, තුන්වන සතියේ මිශනාරී සතිය ලෙස හඳුන්වයි. මෙම සතියේදී සැම ශාඛාවක් විසින් මිශනාරී පඬුරු එකතු කොට ජාතික කාර්යාලය වෙත එවනු ඇත. මෙම පඬුරු සම්පූර්ණයෙන්ම ක්‍රයිස්ට් ගොස්පල් දර්ශනය උදෙසා පමණක් යෙදවිය යුතුය. තවද මෙම පඬුරු ශ්‍රී ලංකාවේ හා විදේශ රට වල ක්‍රයිස්ට් ගොස්පල් සභාව ආරම්භ නොවූ ස්ථාන වෙත සභාව ව්‍යාප්ත වීම සඳහා භාවිතා කරනු ලබයි. පිටුව 15

**<u>දසයෙන් කොටස් හා පැඬුරු</u>**

ඇදහිලිවන්තයා තමාගේ ආදායමෙන් දසයෙන් කොටසක් හා තමාගේ මුළුම සිතින් දෙන ස්තූති පඬුරු ප්‍රදේශිය සභාවට ගෙනෙනු ඇත. මෙම ආදායමෙන් දසයෙන් කොටසක් ප්‍රාදේශිය සභාව ජාතික සභාවට යවනු ලබයි. ඉතිරි

ආදායමෙන් 65% සභාව නඩත්තු කරන්නා වූ පාලකතුමාට ගැනීමට අවසර ඇත. ඉතිරි 35හෙත් 15 ක් ප්‍රාදේශිය සභාවට ඉතුරු වන අතර ඉතිරි 20 ජාතික දර්ශනය උදෙසා ජාතික කාර්යාලයට එවීමට අවශ්‍ය වේ. ආදායම සභා පාලකතුමාගේ 60000/- ඉක්මවන විට ජාතික නායක මණ්ඩලය විසින් එම පාලකතුමාගේ වැටුප තීරණය කරනු ලබයි.එය සිදු වන්නේ සභා පාලකතුමාගේ 65% රුපියල් 60000 ක් ඉක්මවා යන විටය. බයිබල් විදුහල් සඳහා පඩුරු ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ ප්‍රධානම වර්ධනයේ රහස වන්නේ ගොඩ නැගීමට යන්නා වූ බයිබල් විද්‍යාල 04 ය. මෙය සංවිධානයේ හදවත මෙන් වේ. මෙම විද්‍යාල ශ්‍රී ලංකාවේ හතර කොනේම ගොඩ නැගෙනු ඇත. මෙම පාසල් 04 න් පුහුණු කරන්නා වූ දේව දාසයන් ප්‍රධාන එඬේරු 2000 ක් පුහුණු කිරීමට, ප්‍රධානම උපකාර ස්ථානය වේ. මෙහි සම්පූර්ණයෙන් ශුද්ධ වූ ජීවිතයක් තුළ ක්‍රයිස්ට් ගොස්පල් දර්ශනය උදෙසා පූජකයන්, ගුරුවරුන්, පේරිතයන්, සුභාරංචි පිටුව 16

ප්‍රකාශකයන්, අනාගත වක්තෘවරුන් හා සභාපාලකවරුන් පුහුණු කරනු ලබයි. කිසිඳු අයකිරීමක් නොමැති දේව ධර්මය උගන්වන නිසාත්, බොහෝ අවශ්‍යතාවයන් තිබෙන නිසාත් සෑම මසකම සභාවේ පස් වන සතියේ පඩුරු මුදල පමණක් ජාතික සභාවට එවීමට සියළු දේව සේවකයන් බැඳී සිටී.

**ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ තිබිය යුතු දේවල් :-**

කුයිස්ට් ගොස්පල් සභාව පවත්වන්නා වූ සෑම ස්ථානයකම සභාවේ කොඩියද ජාතික කොඩියද, සභාවේ තේමා පාඨයද, ජාතික දර්ශනයද පුදර්ශනය විය යුතුයි. මතෙව් 28:19

එතුමාගේ දරුවත් එතුමා කළ ගැලවීමේ පූජාව සිහි කරනු ඇත. මෙම සිහිකිරීම ක්‍රිස්තුස් වහන්සේ නැවත පොනාවට එන තෙක් අප කළ යුතුය. තවද මෙම ක්‍රියාව ඉතා ශුද්ධව ගෞරවයෙන් ඉතාම උසස් අන්දමින් දේව භය ඇතිව කුයිස්ට් ගොස්පල් සභාව කළ යුතුයි.

ශුද්ධ සහභාගී වීම පවත්වන වේලාවන් මේ සඳහා මාසයේ ස්ථිර දිනයක් නියමකර ගැනීම ඉතා වැදගත් වේ. එවිට ඇදහිලිවන්තයා එයට සූදානම් වේ. සභාවේ බොහෝ සාමාජිකයන් රැස්වන දින ඉතා හොදය.

1. මෙය සභා පාලකතුමාගේ මූලිකත්වයෙන් සිදු විය යුතුය.

2. නියමිත දින කළින් සභාවට දැනුම් දිය යුතුය.

3. මෙම මෙහෙයට උදව් කරන්නන් සභාපාලකයා විසින් නම් කළ යුතුය. (ගෞරවනීය ශාක්ෂියක් ඇති අයා)

4. පරාටී සහ මිදි යුෂ ගැනීම කළ හැක (පූප, පාත් හා රතු පාටට හුරු පානයක් ගත හැක)

වතුර බෞතිස්මය වතුර බෞතිස්මයේ ඇති වැදගත්කම් සභාපාලකතුමා සභාවට ඉගැන්විය යුතුය. ෆ්‍රයිස්ට් ගොස්පල් සභාවේ තේමා පාඨයේද මෙම බෞතිස්මය සඳහන් කරයි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේද මෙම බෞතිස්මය ශුද්ධ වූ යොගත් බෞතිස්තගෙන් ලබා ඇත. මෙම බොතිස්මය සම්පූර්ණ ගිල්ලුවීමේ බෞතිස්මය වේ. මෙම බෞතිස්මය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මහා ආඥාවේද සඳහන් කර ඇත. මතෙව් 28:19-20 - පිටුව 17

සභාවේ සාමාජිකත්වය

ශ්‍රී ලංකා ක්‍රයිස්ට් ගොස් ස්පල් සභාවේ සාමාජිකත්වය ලැබීය හැක්කේ යෝ්යුස් ක්‍රිස්තුස් වහන්සේ, පාපයේ ගැලවුම්කරු ලෙස පිළිගන්නා වූ අයට පමණි. තවද මෙම අය නැවත උත්පාදනය යන වතුර බොතිස්මය පිළිගෙන එය ලබන්නා වූ අය විය යුතුය. තවද මෙම අය ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ දර්ශනය පිළිගෙන සභාව විශ්වාස කරන්නා වූ දේව ධර්මය විශ්වාස කළ යුතුය. සභා පාලකවරයා මෙම දෙව ධර්මය හා ගැලවීම්, නව උපත ඔවුන් සමග සාකච්ඡා කොට උගන්වා පැහැදිලි කර දිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ පිළිනොගන්නා වූ කිසිම පුද්ගලයෙකුට මෙම සභාවේ සාමාජිකත්වය හිමි නොවේ. යමෙක් සාමාජිකත්වය ලැබීමට නම් ඔහු මුළු සිතින් අදහා තමාගේ මුඛයෙන් ක්‍රිස්තුස් වහන්සේ ගැලවුම්කරු ලෙස ප්‍රකාශ කර, සභාවේ ප්‍රසිද්ධ දේව මෙහෙයන් වලට සහභාගී විය යුතුය.

(ඉරු දින ඥව මෙහෙයත්)

ශුද්ධ වූ සහභාගිකමේ මෙහෙය ක්‍රිස්තුස් යේසුස් වහන්සේගේ සේවයේ ඉතාම උතුම්ව ක්‍රියාව මෙම මෙහෙය මගින් පිළිඹිබු වේ. ක්‍රිස්තුස් වහන්සේ, සහ සකල ලෝක වාසීන්ගේ පාපය උදෙසා ජීවිතය පූජා කිරීම හා සදාකාල ජීවනය සියල්ලන්ට උරුමකර දීමට කුරුසියේදී කරන ලද මරණ පූජාව මෙයින් සංකේතවත් කරයි. තවද දෙවිදුන්ගෙත් වෙන්වූ මිනිසාට, කුරුසයේ මරණය හා ඒ ශුද්ධ ලේ වලින් ලැබෙන මිදීම හා නැවත දෙවිදුන් සමග මිනියා සමඟි කිරීම මෙමගින් ප්‍රකාශ වේ. 1 කොරින්ති පොත් 11 පරිච්ඡේදයේ උගන්වන ආකාරයට

අප මෙය සඳහා සභාව සූදානම් කළ යුතුය. මෙය සභා පාලකතුමාගේ වගකීම වේ. මෙම පරිච්ඡේදයේ ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය ප්‍රීතියන් පෙන්වා දෙන අතර එම රොටි හා

කුසලාන ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට හා ශුද්ධ වූ ලෙයට

අධ්‍යාලමක් ලෙස පෙන්වා දේ. රොවලින් අප උදෙසා තුවාල වූ

එතුමාගේ ශරීරයද, කුසලානෙන් අපගේ ගැලවීම උදෙසා එතුමා

වැහිර වූ ශුද්ධ ලෙයද සිහි කරයි. මෙය පවත්වන සෑම මොහ

**බෞතිස්මයට සූදානම් වීම.**

1. බෞතිස්මයට කලින් වතුර බෞතිස්මය යනු කුමක්දැයි සභාපාලකතුමා සභාවට ඉගැන්විය යුතුය. බෞතිස්මය වීම තුළින්ම ස්වර්ගය හිමි නොවන වග ඉගැන්විය යුතුය. බොහෝ සභා වල උගන්වන පරිදි මෙය ස්වර්ගයට යාමට ප්‍රධානම මාර්ගය නොව මෙය ක්‍රිස්තුස්වහන්සේගේ මරණය. - පිටුව 18

හා නැවත නැගිටීම පිළිගැනීමට සංකේතයක් බව ඉගැන්විය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ පිළි නොගෙන ශුද්ධ වූ නව උපත විශ්වාස නොකර බෞතිස්මයෙන් පමණක් ස්වර්ගය හිමි නොවන වග පාලකතුමා ඉගැන්වීය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේදී කළ පූජාව විශ්වාස කිරීම තුළ ගැලවීම ඇත. බෞතිස්මය කල වතුරට පාපය සේදීමට බලයක් නැති බව ඉගැන්වීම වැදගත් වේ. නමුත් බෞතිස්මය අප ක්‍රිස්තුස්වහන්සේ කුරුසි පූජාව හා උත්ථාපනයට සංකේතයක් හා අධ්‍යාලමක් බව විශ්වාස කළ යුතුය. වතුර බෞතිස්මය පිළිබඳ මාස 02 විවත් කලින් ඇදහිලිවන්තයා සූදානම් කිරීම ඉතා වැදගත්ය. බෞතිස්මය ලබන විට එම පුද්ගලයාට පාපය හා නව ජීවනය හා කුරුසි පූජාව තුළින් ලැබෙන ගැළවීම හා සදාකාලික ජීවනය හා සදාකාලික මරණය ගැන අවබෝදයක් ඇතිව සිටීම ඉතා වැදගත් වේ. බෞතිස්මයෙන් පසු දීමට ඉතා හොද පණිවිඩයක් ඇත. එනම් පාපීය මනුෂ්‍යයා දැන් මළබ්වත් ක්‍රිස්තුස් වහන්සේ තුළින් නව උපතක් ලැබී ඇති බවත්ය. මෙය කිතුනුවාට නව දිවි ගමනකට මහත් අත්වැලක්ද වේ. බෞතිස්ම කරන ස්ථානය කල් වේලා ඇතිව සූදානම් කිරීම ඉතා වැදගත් වේ. (උදා: - ටැංකියක නම් අළුත් වතුර පිරවීම) 5. කුමන වේලාවක බෞතිස්ම දේව මෙහෙය පැවැත්විය හැක. මේ සඳහා ස්ථිර වේලාවක් හෝ දිනයක් අවශ්‍ය නොවේ. (සමහර අය පාස්කු දින හා නත්තල් දින හොදයැයි ප්‍රකාශ කරයි) එහි නියම

සත්‍යයක් නැත. ඉරු දින දේව මෙහෙයෙන් පසුව වුවද කළ හැක. මෙය සභාපාලකතුමා විසින් පැවැත්විය යුතු දේව මෙහෙයක් වේ. 19 පිටුව

වතුර බෞතිස්ම දේව මෙහෙය

මෙලි දෙව මෙහෙයේදී. සභාපාලකතුමා කෙටියෙන් බෞතිස්මය හා එහි වැදගත්කම දේශනා කළ යුතුය. මෙය ඉරු දින දේව මෙහෙයකද කළ හැක. ඉරුදිත දේව මෙහෙයක නම් මෙහෙය අවසන් වීමට ප්‍රථම බෞතිස්මය කර අවසන් කළ යුතුය. බෞතිස්ම කරන විට සභාපාලකතුමා විවාහ නම් කාන්තාවන් බෞතිස්ම කරන විට තම භාර්යාව උපකාරයට ගැනීම ඉතාම වැදගත්ය. මොකද බෞතිස්මයේදී සමහර කාන්තාවන් කැලු බැලු වී බයවී වතුර යට් දගලන නිසා ඔවුන්ගේ ශරීරයේ සැම ස්ථානයක්ම සභාපාලක තුමා ඇල්ලීම යෝග්‍ය නොවේ. විවාහ වී නොමැති නම් සභාපාලකතුමා හැකි තරම් දුරට විවාහක පාලක යුවලකගේ උපකාර පැතීම ඉතා වැදගත් වේ. නමුත් තමාගේ පක්ෂයේ අය බෞතිස්ම කිරීමට පාලකතුමාට හෝ තුමියට නිදහස ඇත. (පුරුෂයන් පුරුෂයන් - ස්ත්‍රීන් ස්ත්‍රීන්) මෙම අවවාදය සියල්ලන්ගේම යහපත පිණිසය. බොතිස්ම ටැංකිය තුළ හෝ ජලයේ සිටගෙන හෝ දණගසා ගෙන බෞතිස්මය ලැබිය හැකිය. බෞතිස්මය දෙන විට සභාපාලකතුමා ඒ තැනැත්තාට උඩු බැලි අතට වතුරේ ගිල්ලුවය යුතුය. ගර්භනී අය, රෝගයෙන් සිටින අය සහ වයෝවෘද්ධ වයස්ගත අය පහසු සේ ගිල්වා බෞතිස්ම කළ හැක.

බෞතිස්ම දෙන විට සභාපාලක තුමා කිව යුතු දේ :-

(පුද්ගලයාගේ නම් ).............. නැමැති ඔබව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැලවුම්කරු බවට පිළිගත් බවට ඔබ ප්‍රකාශ කරන නිසා පියාණන් වහන්සේගේද පුත්‍රයායන් වහන්සේගේද, ශුද්ධාත්මයාම්පත් වහන්සේගේ නාමයටද බෞතිස්ම කරමි. දේව මෙහෙය අවසානයේදී බෞතිස්මය ලැබූ තැනැත්තාට ඔහුගේ නව ජීවිතය පිළිබඳ උපදෙස්

දීම ඉතාම යහපත්ය.

බෞතිස්මය අවසන් වූ පසු එම මෙහෙයෙදීම බෞතිස්ම සහතිකය දිය හැක. (මෙය අලුත් ජීවිතයට තවත් දිරි ගැන්වීමක් විය හැක). 20 පිටුව

සභාපාලකතුමාගේ වාර්ථාපොතේ තිස්මය

තැනැත්තාගේ විස්තර සටහන් කිරීම ඉතා වැදගත්ය. (මෙය ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ සම්පූර්ණ සාමාජිකත්වයට ඉතා වැදගත් වන නිසා)

කුඩා දරුවන් කැප කිරීම

ගීතාවලිය 127:3 - 4 අනුව දරුවන් ස්වාමීන් වහන්සේගේ දිව්‍ය වූ ආශිර්වාදයක් වේ. දරුවන් කැප කිරීම ප්‍රසිද්ධ මෙහෙයක කළ යුතුය. ඉරු දිනම සභාපාලකතුමාට මෙය කළ හැක. ප්‍රධාන දේව මෙහෙයේ නමස්කාරයට පසුව කෙටි වේලාවක් රැගෙන මෙය කළ හැක. නමුත් දෙමව්පියන් වෙනම දිනයක් ඉල්ලා සිටින්නේ නම් පාලකතුමා එයට විරුද්ධ නොවිය යුතුය. බොහෝ විට එවැනි අවස්ථාවල අසල්වාසීන් හා නොහැදිලිකාරයන් හා ඥාතීන් සිටින නිසා සුභාරංචිය ප්‍රකාශ කිරීමට මෙය කදිම අවස්ථාවක් වේ.

මෙම කැප කිරීමේදී දෙමව්පියන්ට තම දරුවන්, දෙව්පියාණන්ට අයිති බව මතක් වන අතර තම දරුවන් දිව්‍ය පාමුල ගොඩ නැගීමට පොරොන්දුවක් දෙවි සමින්ට දුන් බව පිවිත කාලය පුරාම මතක් වන අවස්ථාවක් වේ. එම නිසා දරුවන් කැප කිරීමට දෙමව්පියන් උනන්දු කිරීම සභාපාලකතුමාගේ වගකීම වේ. නමුත් දරුවන් කැපකිරීම ක්‍රිස්තියානි කිරීම නොවන බවත්, කැප කළ දරුවෙක් අනිවාර්යෙන්ම ස්වර්ගයට යන බව යන වැටහීම නිවරදිව කළ යුතුය. යමෙකු ස්වර්ගයට යන්නේ ක්‍රිස්තුස් වහන්සේ පුද්ගලිකව විශ්වාස කිරීමෙන් වග ඉගැන්විය යුතුය.

**දරුවන් කැපකරන විට පාලකතුමා අනුගමනය කළ යුතු අනු පිළිවෙල :-**

1. කැපකිරීමේ ඇති වැදගත්කම පාලකතුමා දේව මෙහෙයට කලින් දෙමව්පියන් සමග සාකච්ඡා කළ යුතුය.

2. මෙය බෞතිස්මයක් නොවන වග පැහැදිලි කළ යුතුය.

3. කැපකිරීම මෙහෙය දරුවන්ට පමණක් අයිති දෙයක් ෂතාව දෙමාපියන්ටද කැප වීමට හොද අවස්ථාවක් වේ.

21 පිටුව

4. සභාපාලතුමා කැපකිරීමට ප්‍රථම පියාගේ හා මවගේ නම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට දරුවාගේ නමද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට කැප කිරීමට ගෙනවිත් ඇති බව කිව යුතුය. (දරුවගේ නම කලින් අසා දැන ගත යුතුය. එම වේලාවේදී ඇසීම ගෞරවයක් නොවේ)

5. දරුවෙකු කැප කරන විට දෙමව්පියන් දෙදෙනාම සභාපාලකයා ඉදිරියේ සිටිය යුතුය. විශේෂයෙන් දරුවා කැපකරන විට දරුවා පියා විසින් සභාපාලකතුමා අතට භාර දිය යුතුය. නමුත් දරුවා අඬන්නේ නම් පමණක් මවගේ අතේ දරුවා තබා ගත හැක. (බොහෝ දරුවන් අඬන විට නැලවීමේ හැකියාව මවට ඇත)

6. ඉන් පසුව සභාපාලකතුමා ඊට අදාළ කෙටි බයිබල් පද කියවිය යුතුය. ගීතාවලිය 127:3-4 1 සාමුවෙල්, 1:20-28 ගීතාවලිය 103:17-18 මතෙව් 19:13-15

7. බයිබලය කියවීමෙන් පසු සභාපාලකතුමා මෙසේ කිව යුතුය. (ආ) ...... සහෝදර සහෝදරිය (දෙමාපියන් යුවළගේ (දරුවාගේ ත).. න) නැමැති දරුවා කැපකිරීම පිණිස රැගෙන ඇවිත් තිබේ. (දෙව මෙයට කළින් පිරිමි දරුවෙක්ද ගැහැණු දරුවෙක්ද කියා දැන ගන්න. නැතිනම් සභාපාලකතුමාට එය ලැජ්ජාවක් දෙමව්පියන්ගෙන් මෙම ප්‍රශ්නය අසන්න. සභාපාලක - ප්‍රේමවන්තයෙනි, මේ දරුවා කැප කරන මේ මොහොතේ ඔබගේ මුඛය තුළින් ප්‍රකාශ කලා වූ වචන තුළින් මේ දරුවා නඩත්තු කිරීමට පදවියන් වහන්සේ ඉදිරියේ පොරොන්දු වෙනවාද? නැතහොත්, ඔබ දෙවියන් වහන්සේ ඉදිරියේ පුහුණු කිරීමට හා දේව වචනයට අනුකූලව වර්ධනය කරන බවට පොරොන්දු වන්නේද?

22 පිටුව

දෙමාපියන් :- ඔව් අපි කරනවා

ඉන් පසුව සභාපාලකතුමා දරුවා පියාගේ අතින් ගෙන කිව

යුතු දේ :-

මම දැන්...........(දරුවාගේ නම්) නැමැති මේ

දරුවා පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් නාමයෙන් කැප කරයි. ඉන් පසුව දරුවා උදෙසා යාච්ඤා කළ යුතුය. මේ යාච්ඤාවේදී දරුවා දුන් නිසා දෙවිඳුන්ට ස්තුති කිරීමද කළ යුතුය. දේව කැමැත්ත අනුව දරුවා වර්ධනය වන පිණිස යාච්ඤා කළ යුතුය. මේ සමඟම දෙමාපියන් උදේසා යාඥා

කළ යුතුය. ඔවුන්ට දේව කරුණාව හා ආශිර්වාදය ඉල්ලා යාච්ඥා කළ යුතුය. තවද තවත් වැඩිමහල් දරුවන් සිටිනම් ඔවුන්ට මේ අවස්ථාවේ ආශිර්වාදය ඉල්ලා යාච්ඥා කරන්න. ඉන් පසුව දරුවා දෙමාපියන්ට භාර දෙන්න. ඉන්පසුව ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ දරුවන් කැපකිරීමේ සහතිකය පිරිනැමිය හැක. (එය තවත් ධෛර්යයක් ඔවුන්ට ගෙනෙනු ඇත)

**සභාවේ අවමංගල්‍ය දේව මෙහෙය**

පාලකතුමාට අවමංගල්‍ය දේව මෙහෙයක් පවත්වන්න කියා ඇදහිලිවන්තයා ඉල්ලා සිටින විට ප්‍රථමයෙන් සභාපාලකතුමා අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග කිහිපයක් වේ.

1. ප්‍රථමයෙන් ඔහු හෝ ඇය ගැලවීම් ලබා ඇත්දැයි සොයා දැන ගන්න.
2. ප්‍රථම වතාවේ නිවසට යන විට එය දැන ගැනීමට නොහැකිනම් දෙවන වතාවේ ගොස් දැනගත්ත,
3. පවුලේ අයගෙන් අවසාන කැමැත්ත ගැන දැනගන්නා විට පවුල් විරෝධතා ඇත්නම් ඒවා පුළුවන් තරම් සමතයකට පත් කිරීමට පාලකතුමා මැදිහත් විය යුතුය. 23 පිටුව
4. පවුලේ සමාජිකයන් කිතුණු ක්‍රමයට අවමංගල්‍ය උත්සවය කිරීමට අසාමැත්ත එල කරයි නම් පාලකතුමා එය උසා බලපෑම් නොකළ යුතුය. (මන්ද, කිතුණු ක්‍රමයට කිරීමෙන් මිය ගිය පුද්ගලයා ස්වර්ගයට නොයන නිසා)
5. ඉන් පසුව පවුලේ ඥාතීන්ට හා මිය ගිය පුද්ගලයාගේ භාරකරුවන්ට කිතුණු මරණයක් පවත්වන පිළිවෙල හොඳින් වටහා දිය යුතුය. (සමහර විට මෙම පවුලට මෙය අළුත් දෙයක් විය හැකි නිසා)
6. මැරුණා වූ පුද්ගලයා මැරෙන්නට කළින් තමාගේ මිනියට අන්දත ඇඳුම හා කියවිය යුතු බයිබල් පාඨය සඳහන් කර ඇත්නම් එයට පාලකතුමා ගෞරව කළ යුතුය.
7. බොහෝ පවුල්වල අය තමාගේ පවුලේ ඥාතීන් දරණ ආකල්ප හා ඔවුන්ගේ ආගම් හා මතිමතාන්තර පාලකතුමාට මේ අවස්ථාවේ පැහැදිලි කර දීමට උත්සහ කරයි. එම නිසා පාලකතුමා. එයට මැනවින් ඇහුන්කම් දී ඔවුන්ට හිත් රිදවීමක් හෝ පහර දීමක් නොවන ලෙස අවමංගල්‍ය උත්සවය පැවැත්විය යුතුය. විශේෂයෙන් දේශනයේදී

අනිකුත් ආගම්වලට පහර දීම නොකළ යුතු අතර පාලකතුමා සිහි නුවණින් ක්‍රියා කිරීම අවශ්‍ය වේ.

යේසුස් වහන්සේ ලාසරුස්ගේ මළගෙදරදී ක්‍රියා කළ ආකාරය පාලකතුමා සිහියට ගත යුතුය.

**පවුල සමග සභාපාලකතුමා සාකච්ඡා කළ යුතු දේ :-**

1. අවසාන දිනය
2. දේව මෙහෙය පවත්වන වේලාව
3. මැරුණා වූ පුද්ගලයාගේ ගුණ කථන කරන්නේ කවුද?
4. මැරුණා වූ පුද්ගලයාගේ සම්පූර්ණ නම, උපන්දිනය, වයස හා ඔහුගේ විවාහක භාවය දරුවන් ගැන, ගැලවීම ලබා ද යන්න වග 24 වන පිටුව
5. එදිනට ගායනා කරන ගීත
6. දේව මෙහෙයේ පිළිවෙල (පෙට්ටිය තබන අයුරු, පවුලේ ඥාතීන් වාඩි වී සිටින තැන, පූජකවරුන් වැඩිවන තැන)

**දේව මෙහෙය පවත්වන ක්‍රමය**

1. ආරම්භක යාව
2. ගීතිකා භායනය
3. බයිබල් පදයක් හෝ දෙකක් කියවීම (කියවන්නා ඉතාගෞරවයෙන් පැහැදිලි උච්චාරණයෙන් කිය විය යුතුය)
4. ගුණකථනයක්
5. ගීතිකාවක්
6. දේශනාව
7. යාච්ඤා කිරීම

**අවමංගල්‍ය දේව මෙහෙයේ දේශනාව**

අවමංගල්‍ය දේව මෙහෙයේ දේශනාවේදී ප්‍රධාන කරුණු වෙත

අපගේ අවධානය යොමු විය යුතු වේ.

1. පණිවිඩය සම්පූර්ණයෙන් දේව වචනයට අදාළ විය යුතුය.

2. අනිකුත් ආගම් හා විශ්වාසයන්ට පහර දීම නොකළ යුතුය.

3. දේව වචනයේ සඳහන් සදාකාල ජීවනය හා මතු පැමිණෙන රාජ්‍ය ගැන කථා කළ යුතුය.

4. දේශනාව පිවතුන් අතර සිටින්නට විය යුතුයි. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසි පූජාවේ සතය ඉස්මතු විය යුතුය.

5. අවමංගල්‍යා දේශනාවේදී පාලකතුමා ඉතා කරුණාවන්ත භාවයෙන් ක්‍රියා කළ යුතුය. (ලාසරස්ගේ මලගෙදර යේසුස්

වහන්සේ කඳුළු සැලුව ආකාරය පාලකතුමා සිහියට ගත යුතු වේ.)

25 පිටුව

**කනත්තේ පවත්වන දේව මෙහෙය**

කනත්තට අවමංගලය පෙරහැර පැමිණි විට මිනී පෙට්ටිය තබා තිබෙන රථයට පිටුපසින් සභාපාලකයා ගොස් එය එළියට ගන්නා තුරු සිටිය යුතුයි. ඉන්පසුව ඉදිරියට ගොස් මිහිවල දක්වා ඒ පෙරහැර නඩත්තු කළ යුතුයි. මෙය රථවාහන පෙරහැරට පමණක් අයිතිය. කරින් පෙට්ටිය ඔසවා ගෙන එනවා නම් කනත්තේ ගේට්ටුව ලඟ සිට සභාපාලකයා ඉදිරියට ගොස් මිනීවල දක්වා පෙරහැර නඩත්තු කළ යුතුයි.

මිනී පෙට්ටියෙන් පිටුපස මැරුණු අයගේ නෑදයත්, සහෝදරයන්, මිත්‍රයන් පැමිණේ. ඔවුන් පැමිණ තමාට පහසුකම් තිබෙන ස්ථානයක සිට ගනී. සභාපාලකයා මිනීවල් පාදය පැත්තේ සිට හිස පෙනෙන අයුරින් සිටිය යුතුය. ඔහුට හිස පැත්තේ සිටින්නට අවස්ථාව සලසා තිබේ නම් එයට විරුද්ධතාවය නොපෙන්වා එය කළ යුතුයි. නෑදෑයින්, මිත්‍රයින් තමාට පහසු ආකාරයට ඉඩ ලබා ගෙන සිටියායින් පසු අවසාන දේව මෙහෙය පටන් ගත යුතුයි.

මේ දේව මෙහෙයේදී යොහාන් 11 වන පරිච්ඡේදයේදී ලාසරුස්ගේ නැවත නැගිටීමද, එළි 21 පරිච්ඡේදයේදී ස්වර්ගය ගැන ඇති බලපොරොත්තුවද, 1 කොරින්ති 15 පරිච්ඡේදයේ නැවත නැගිටීම ගැන ඇති සත්‍යතාවයද ගෙන අවශ්‍ය අදහස් කියවා ඉන්පසු යාච්ඤා කරත්න. (මෙයින් එකක් තෝරා ගන්න.)

ඉන්පසු පස් රැගෙන මෙසේ කියා තුන් වතාවක් පෙට්ටිය උඩට පස් දමන්න. "අප සමඟ සිට වෙන් උනා (සහෝදරයාගේ නම හෝ සහෝදරියගේ නම් ............

ප්‍රාණය මේ ලෝකයේ සිට ලබා ගන්නට දෙවියන් වහන්සේ කැමති වුණ නිසා මේ ශරීරය පසට පස්, අළුවට අළු, දූවිල්ලෙන් දූවිල්ලට ද භාර දෙමි. ආමේන්,

මේ දේව මෙහෙය අවසන් වූ විගසම සභාපාලකයා මැරුණු අයගේ පවුලේ සාමාජිකයන් සමඟ සාකච්ඡා කර ඔවුන්ට තමාගේ සැළකීම දක්වා, තව දුරටත්, ඒ පවුල උදෙසා යාච්ඤා කරන බව දක්වා නිවසෙන් පිටවී යාමට පුළුවන.

26 පිටුව

අවසාන දේව මෙහෙය අවසන් වූ පසු පැමිණෙන්නා වූ දින කිහිපය නම් මේ පවුලට දුක වේදනාව ලගා කරන්නා වූ දින කිහිපයක් වේ. ඔහුගේ / ඇයගේ නැතිවීම ඔවුන්ට දරා ගන්නට මේ දින කිහිපය තුළදී ඉතාමත් අපහසුය. ඒ නිසා මෙවැනි අවස්ථාවලදී මේ පවුල අමතක නොකර ඔවුන්ගේ නිවසට ගොස් ඔවුන්ගේ සිත් සැකසීමට හැකි අයුරින් ඔවුන්ට උදව් කළ යුතුයි.

**අවමංගල්‍ය දේව මෙහෙයේදී කියවිය හැකි දේව වචනය**

- කනත්තේදී පාවිච්චි කළ හැකි කොටස : යොහාන් 11:24-28 /යෝබ් 1:25–27/1 තිමෝති 6:7 /යෝබ් 1:20
- වයසට පැමිණි අයෙකුගේ දේව මෙහෙෂයෙදී කියවිය යුතු කොටස් : 1 කෝරින්ති 15:20 - 24/1ත:4:13-18/ යෝබ් 1:21
- කුඩා දරුවකුගේ දේව මෙහෙයෙදී කියවිය යුතු කොටස් : මතෙව් 19:14 / මාක් 10:14
- සෑම ක්‍රිස්තියානි ආසයෙකුගේම අවසන් දේව මෙහෙයේදී කළ යුතු කොටස්:-1 කොරින්ති 05:1
- අවශ්‍යතාවය අනුව පාවිච්චි කලහැකි කොටස් : පිලිප්පි 3:20-21 /1කොරින්ති 15:49 / 2:9 – 10/ 1 යොහාන් 14:2 ක්‍රියා 14:13/7:17/ 21:14/22:05/2 කොරින්ති 4:17/ ගීතා :90

<u>ඉරු දින දේව මෙහෙය</u>

ඉරුදින දේව මෙහෙයේදී මෙම ප්‍රධාන කරුණු තිබිය යුතුයි.

1. ගීතිකා සහ කෙටි ගීතිකා
2. සාක්ෂි
3. පඩුරු
4. දැන්වීම
5. අවශ්‍යතා උදෙසා යාච්ඤා කිරීම
6. දේශනාව
7. අවසන් කිරීමේ යාච්ඤාව
27 පිටුව

**සතිය මැද දේව මෙහෙය**

සබත් දින හැර අනික් සතියේ මැද දිනවලදී පැවැත්වීමට පුළුවන්.

**දේව මෙහෙයේදී තිබිය යුතු ප්‍රධාන දේවල්**

1. ප්‍රශංසාව සහ යාච්ඤාව
2. සක්ෂි
3. යාච්ඤාව
4. බයිබලය ඉගන්වීම
5. අවසන් යාච්ඤාව

**එළිමහන් හා වීධි වල පවත් වන්නා වූ රැස්වීම්**

අ) එළිමහත් රැස්වීමේ ඇති වැදගත් භාවය ගැන සභාවේ අයට ක්‍රමානුකූලව සභාපාලකයා කියා දිය යුතුයි.
ආ හරි ස්ථානවලදී පැවැත්විය යුතුයි.

1. මනුෂ්‍යයා වැඩියෙන් රැස්වන්නා වූ ස්ථානවලදී
2. පොහොසත් අය ජීවත්වන්නා වූ ස්ථානයක්, දුප්පත් අය ජීවත් වන්නා වූ ස්ථානයත් තෝරා නොගෙන දෙකොටසටම පොදු ස්ථානය තෝරා ගන්න
3. ඇදහිලිවන්තයාට පහසු ස්ථානයක් තෝරා ගත වෛද්‍ය විය යුතුයි.

ඇ) පොලිසියේ අවසර ලබා ගත යුතුයි.

1. රැස්වීම් තබන්නා වූ ස්ථානය අසල ජීවත්වන්නා වූ අසව මිත්‍ර කර ගත යුතුයි.
2. ඒ ප්‍රදේශයේ නායකයා / ගමේ නායකයාගේ අවසර ගත යුතුයි.
ඇ) අනෙක් අයට පිබිදීමක් ගෙන දෙන්නා වූ වැඩ සටහනක් විය යුතුයි.
1. බොහෝ ඇදහිලිවන්තයන්ට සහභාගි වීමට උනන්දු කළ යුතුයි.
2. හොද තයලත්ත ඇති අයව පාවිච්චි කළ යුතුය.
28 පිටුව

3. හොද සාක්ෂි සූදානම් කළ යුතුය. (නියමිත විෂයය ගැන පමණක් කථා කරන්න. අනවශ්‍ය ලෙස ආගම් පහත් කර කථා නොකරන්න)

4. සහභාගී වන සැම කෙනෙක්ම පිරිසිදු ඇඳුම් ඇදිය යුතුය.

5. දෙව මෙහෙයට පෙර වැඩියෙන් යාච්ඤා කළ යුතුය.

6. සූදානම් කළා වූ දේශනයක් අවශ්‍යයයි.

7. ලිපිතය ගැනීමටත්, අවවාද දීමටත්, අනික් අයට උදව් කිරීමටත්, යාච්ඤා කිරීමටත්, පුහුණුව ලබා ගත් අය අවශ්‍යයි.

8. රැස්වීම අවසන් වී දින 7 ක් තුළ තීරණ ගත් අයව හමු වී ඔවුන්ට ශක්තිමත් කර තව දුරටත් ඔවුන්ට ධෛර්යමත් කළ යුතුයි.

9. බොහෝ නොහැදිලිවන්තයන් සහභාගිවන්නා රැස්වීමක් නිසා (ඔවුන්ගේ අවධානය අප වෙතට යොමු කරන්නේ ටික කාලයක් නිසා)

10. අනිත දේවලට ගත කරන්නා වූ වේලාව අඩුකර පණිවිඩයටත්, අවශ්‍යතාවය ඇති ව යාච්ඤා කරන්නටත් වැඩි වේලාවක් ගත කරන්න.

**පාවිච්චි කිරීමට හැකි වැඩ සටහන්**

- ගීතිකා සහ කෙටි ගීතිකා (විනාඩි 15 ක් පමණ)
- සාක්ෂිය
- විශේෂ ගීතිකා
- විශේස ගීතිකා
- පණිවිඩය
- අවශ්‍යතා උදෙසා යාච්ඤා කිරීම

**නිවෙස්වල පවත්වන බයිබල් පාඩම් මාලාව**

ආ) මෙය බයිබලය තුළින් ඔප්පුව ඇත. ක්‍රියා 20:19-21

**ආ) මේ සේවය කරන අයට තිබිය යුතු සුදුසුකම්**

1. යටහත්කම (19 පදය)

2. හොඳ ප්‍රතිඵල ඇති කරන ක්‍රමයන් පාවිච්චි කිරීම(20)

3. සරළව පැහැදිලි ලෙස තිබෙන්නා වූ පණිවිඩය ප්‍රකාශ කිරීමට (21 පදයා)

29 පිටුව

**ඇ) මෙහි අරමුණු 2 ක් තිබේ**

1. සුභාරංචි සේවය - වචනය අසන්නා වූ අයව ක්‍රිස්තුස් වහන්සේව පිළිගන්නා පිණිස කැදවීම. ඉන්පසුව ඒ අයව පුහුණු කිරීම.

2. පුහුණු කිරීම - සේවය භාර ගැනීමට හැකි තිමෝතිවරුන්ට පුහුණු කරන්න. එවිට ඔබට වෙනත් සේවයක් ආර්ථික කළ හැකිය.

**ඇ) ප්‍රතිඵල ඇති කරන්නා වූ සේවය කිරීමට සමහරක්**

**අවවාද**

1. උවමනාවට වඩා සංවිධානය නොකරන්න,

2. සිටගෙන වැඩ සටහන් නොකර වාඩි වී කරත්ත.

3. පරිච්ඡේද හා පද නොකියා, පිටුවද පදයද කියන්න, (අලුත් අය නිසා)

4. දේශනා නොකර ඉගැන්විය යුතුයි. හඬ පාලනය කළ යුතුයි.

5. සැම කෙනක්ම එක බයිබල් පරිවර්තයක් පාවිච්චි කරන්නේ නම් වඩාත් හොදයි.

6. විනාඩි 15 ක් පමණ කාලයක් බයිබල් පාඩම් මාලාව නඩත්තු කර ඉන්පසු ප්‍රශ්න අසන්ට ඉඩ දෙන්න.

7. පවුලේ අය නිවසේ සිටින විට පැයක් පමණ එක් රැස්ව සිටින්න.

ඉ) **ඉගැන්විය යුත්තේ මොනවාද?**

1. තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාවක් පාවිච්චි කළ හැකියි.

2. මූලික දේව ධර්මය ඉගැන්විය යුතුය. (පාපය. ගැලුවීම)

3. යොහාන් සුභාරංචිය ඉගැන්විය හැකිය. 30 පිටුව

ඊ) අලුත් පාඩම් මාලාවක් පටන්ගත හැක්කේ කෙසේද? කොහොමද?

1. සභාවේ සාමාජිකයන් තමාගේ නිවස විවෘත කරන්ට උනන්දු කළ යුතුයි.

2. අලුත් ඇදහිලිවන්තයා තමාගේ නිවස ඇරදෙට උනන්දු කළ යුතුය.

3. අවස්ථාවක් ලැබුනහොත් දුර ස්ථානවලට යන්නටත් සූදානම් විය යුතුයි. 30 පිටුව

ඕ) මෙහි ප්‍රතිඵල

1. පවුලේ එක්කෙනෙක් ගැලවීමට පැමිණ අනික් අය ගැලවීමට පැමිණ නැත්තම්, ඔවුන්ට සුභාරංචිය ඇසීමටත්, අනික් අයගේ අත්දැකීම් දැන ගන්නටත් ඔවුන්ට පුළුවන.

2. නිවෙස්වලට සෙනග කැඳවීම පහසුය. තමා සිටින්නා වූ ආකාරයන්ම ඔවුන්ට පැමිණිය හැකිය.

3. නිවෙස් පසුබිමේදී සෙනගට තමාගේ අවශ්‍යතාවය බෙදා ගැනීමට පුළුවන.

4. අලුත් සභාවත් පටන් ගැනීමට පුළුවන.

5. පැහැදිලිව ප්‍රතිඵල දකින්නට පුළුවන

මේ ක්‍රමය උපයෝගි කර ගැනීමෙන් අළුත් ගිවිසුමේදී බොහෝ ප්‍රතිඵල ලබා ගත් බව අපට දැකීමට පුළුවන

1. මාතා සහ මරියාගේ නිවස. ලූක් 10:39

2. කොරනේලියස්ගේ නිවස ක්‍රියා 10:22

3. විදියාගේ නිවස. ක්‍රියා 16:14-15

4. පිළිපප්පි දේශයේ සිර ගෙදර භාර නිලධාරියාගේ නිවස. ක්‍රියා 16:32

වැඩිවිය පත්වූ විට පවත්වන දේව මෙහෙය බොහෝ දෙමව්පියන් බොහෝ දියණියත් වැඩිවියට පත් වූ විට සභාපාලකතුමාව කැඳවා යාච්ඤා කිරීමට ද උත්සවයක් පවත්වන්නට ද කැමති වේ. එවැනි අවස්ථාවකදී සභාපාලකයා ඔවුන් 31 පිටුව

සමඟ විරුද්ධ නොවී එයට එකග විය යුතුය.

**එම අවස්ථාවේදී ක්‍රියා කළ යුතු ආකාරය**

- ඒ නිවසට ඇතුල් වූ විගසම එම ගැහැණු ළමයා එළියට නොකැඳවන්න. දෙමාපියන් එය නොකරනවානම් ශාලාවේ සිට යාච්ඤා කර ආපසු එන්න. සභාපාලකයා විවාහ වූ කෙනෙක් නම් තමාගේ භාර්යාවද විවාහ නොවූ කෙනෙක් නම් සභාවේ සිටින වැඩිමහල් ස්ත්‍රියක්ව කැඳවා ගෙන එම ගැහැණු ළමයාට අවවාද දෙන්නටත් ඇයට යාච්ඤා කිරීමටත් පුළුවන.
- ඒ ගැහැණු ළමයා නිසා උත්සවයක් පවත්වනවා නම් ඊට නියමිත දවස / වෙලාව දැන ගන්නා අතර සංස්කෘතියක් සමඟ ගැලපෙන්නා වූ අන්‍ය ජාතීන්ගේ ආගමික චාරිත්‍ර වාර්තු නොකරන්න කියා අවවාද දිය යුතුය. (දවස/වේලාව ශාස්ත්‍ර බැළීම එවැනි දේ)
- මේ විශේෂ දේව මෙහෙය පටන් ගැන්මේදී කුපික් සඳහා එක්රැස් වී සිටිනවාද කියා ප්‍රකාශ කළ යුතුයි.
- මෙම දේව මෙහෙය පොදුවේ පැවැත්විය යුතුයි. නමුත් සුභාරංචිය. කෙටියෙන් ප්‍රකාශ කළ යුතුයි. බොහෝ නොඇදහිලිවන්තයා මෙයට පැනත නිසා ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට සහ පාලකයා උත්සහ ගත යුතුයි.

**උපන්දින දේව මෙහෙය**

දේව මෙහෙය බොහෝ දෙනෙක් පැවැත්වීමට කැමති නිසා උපන්දින දේව මෙහෙයකට සභාපාලකයාට ආරාධනයක් ලැබුනොත් ඔහු ක්‍රියා කළ යුතු ආකාරය :-

a) උපන්දිනය පවත්වන්නා වූ දිනය, ස්ථානය, වේලාව කල් වේලා ඇතිව දැන ගත්හ.

b) දේව මෙහෙය පටන් ගැන්මේදී රැස්ව සිටින්නා වූ හේතුව ප්‍රකාශ කළ යුතුයි.

**32 පිටුව**

c) මෙය සුභාරංච දේව මෙහෙයක් ලෙස පැවැත්විය යුතුයි. පැමිණ සිටින්නා වූ නොඇදහිලිවන්තයින්ට ගැලවීම ගැන කියා දීමට අවස්ථාවක් කර ගත යුතුයි.

d) දේවමෙහෙය අවසානයේදී උපන් දිනය අයිති තැනැත්තාව ඉදිරියට කැඳවා ඔහුට අත තබා යාච්ඤා කරන්න. මේ යාච්ඤාවේදී පසුගිය කාලයේදී ආරක්ෂා කලා වූ දෙවියන් වහන්සේට ස්තූති කර අලුත් අවුරුද්දේ ද දෙවියන් වහන්සේගේ කරුණාව ආරක්ෂාව/ සුවය/ ආශිර්වාදය ලබන පිණිස යාච්ඤා කරන්න. කුඩා දරුවෙක්ගේ උපන් දිනයක් නම් දෙමව්පියන් කැදවා ඔවුන් උදෙසා යාච්ඤා කරන්න.

**ඇළුත් නිවසකට ඇතුලු වීම**

ඇදහිලිවන්තයා අලුත් නිවසක් සාදා එයට ඇතුල්වන විට හෝ අලුතින් කුලී ගෙයකට ඇතුලු වන විට සභාපාලකයා කැඳවා දේව මෙහෙයක් පැවැත්වීමට ආරාධනා කරන අවස්ථාවකදී සභා පාලකයා ක්‍රියා කළ යුතු අන්දම

a) සමහරක් අය නිවසක ජීවත් වීමට පටන් ගැනීමට පෙර කිරි උතුරවන චාරිත්‍රය සාමාන්‍යයෙන් සිදු වන්නකි. සංස්කෘතිය අනුව මෙය කරන්නේ කිරි හා සමානව ආශිර්වාදය උතුරා යා යුතුයි කියන බලාපොරොත්තුවෙනි. මෙය කළ යුතුමයි කියා සභාපාලකයා වන ඔබට කවුරුන් හෝ පැවසුවොත් එය වැලැක්විය යුතු නැත. කවරකු හෝ එය කරන්නට කැමති නොවුනහොත් සභාපාලකයා විසින් එය කළ යුතුමයි කියා බල නොකරන්න. එසේ කරනවා නම් ඔබ වැරදිය.

b) ඒ උත්සවයේදී අලුත් අය සිටී නම් අනිවාර්යයෙන්ම ඔවුන්ට සුභාරංචිය ප්‍රකාශ කළ යුතුය.

c) යාච්ඤා කරන විට ඒ නිවසටත් ඒ නිවසේ ජීවත් වන අයටත්, ආශිර්වාදය, ආරක්ෂාව, සුවය, කරුණාව ඉල්ලා යාච්ඤා කරන්න.

33 පිටුව

**විවාහයකට අවසර දීමේ දේව මෙහෙය**

මෙය විවාහය නොවේ. නමුත් විවාහ වීමට තීරණ ගත්තා වූදෙදෙනෙක් තව දුරටත් එකිනෙකාව වටහා ගැනීම පිණිස ගිවිසුමකට ඇතුල් වීමයි. මෙය විවාහයක් නොවන නිසා විවාහ වීමට බලාපොරොත්තු වන දෙදෙනා අඹු සැමියන් ලෙස ජීවත් වීම නොකළ යුතුයි. විවාහයට පෙර ලිංගික සම්බන්ධතාවය ඇති කිරීම පාපයකි. මේ දෙදෙනාට යාච්ඥා කරන විට ඔවුන් දෙදෙනා එකිනෙකාව තව දුටත් වටහා ගැනීමට දෙවියන් වහන්සේගේ කරුණාව ලබා දෙන්න කියාත්, විවාහය ගැන ඇති ගැඹුරු සත්‍යතාවය වටහා ගන්නා පිණිසත් යාච්ඥා කරන්න. අවසර දීමේ දේව මෙහෙය අවසන් කර විවාහය සිදුවන දිනය දක්වා ඇති කාලයේදී සභාපාලකයා මොවුන් දෙදෙනා සමඟ කාලය ගත කර තව දුරටත් අවවාද දිය යුතුය. එපමණකින් නතර නොවී ඔවුන් විවාහයට පෙර පාපයට ඇතුල් නොවන පිණිස අවවාද දිය යුතුයි. විවාහයට අවසර දීමේ දේව මෙහෙයේ වැඩ සටහන :-

- පටන්ගැන්මේ යාච්ඥාව
- ගීතිකාව
- බයිබලය කියවීම
- ගීතිකාව
- දේශනාව
- ගීතිකාව
- මුදු මාරු කිරීම
- දෙනා උදෙසා යාච්ඥා කිරීම
- අවසාන යාච්ඥාව

34 පිටුව

**ශුද්ධ වූ විවාහය**

සභාපාලක සේවයේදී මෙය ඉතා වැදගත් සේවයකි. ඇයිද කිවහොත් එක මාංශයක් වශයෙන් ජීවත්වීමට තීරණ ගත්තා වූ දෙදෙනෙක්ව එකතු කරන්නා වූ ආත්මික වචන මොහු කථා කරන නිසයි. මනුෂ්‍යයාගේ සතුටුවීම සහ ආශිර්වාදය පිණිස දෙවියන් වහන්සේ විවාහය ඇති කරන ලදී. දෙවියන් වහන්සේගේ කැමැත්ත ප්‍රසිද්ධියේ ඉටුවන්නා වූ මේ දෙව මෙහෙයේද දේව සේවකයා ප්‍රධාන ස්ථානයේ සිටී. ඒ නිසා දේව භය සමගින් සූදානම් වීමත්, විවාහය පවතින සෑම අවස්ථාවකම සභාවටත්, ක්‍රිස්තුස් වහන්සේටත්, අතර තිබෙන සම්බන්ධතාවය ප්‍රකාශ කිරීම ගැනත් ඔබ නිතර සිතිය යුතුයි.

අ) විවාහයට සූදානම් වීම

මෙවැනි දේව මෙහෙයට බොහෝ ලෙස සූදානම් විය යුතුය. සමහර දේවලට බොහෝ කලක සිට සූදානම් විය යුතුයි. සමහර දේවල් සඳහා එතරම් කාලයක් ගෙන සූදානම් විය යුතු නැත.

1. විවාහවීමට යන්නා වූ දෙදෙනාට විවාහය, පවුල, දරුවන් ඇතිකිරීම මෙවැනි දේ පිළිබඳව ඇති සත්‍යතාවය ඉගැන්විය යුතුය.අඩුම වශයෙන් පැය 03 ක් වත් මේ වෙනුවෙන් කාලය ගත යුතුව ඇත. මේ ආකාරයෙන් කාලය නොගෙන මේ විවාහය සිදු කිරීම පිණිස සභා පාලකයා ඉදිරියට නොපැමිණිය යුතුය.

**1.1 විවාහය පිළිබඳව ඇති රටේ නීතිය අනුව ක්‍රියා කළ යුතුය.**

දෙදෙනෙක් විවාහවන විට තමාගේ විවාහය ලියාපදිංචි වන්නා සමඟ රජයේ ලියාපදිංචි විය යුතුයි. විවාහයට සති 2 කට පෙර මනාලිය සහ මනාලයා තමාගේ ප්‍රදේශයේ සිටින්නා වූ ලියාපදිංචි කාර්යාලයට ගොස් ඔවුන්ගේ විවාහය පිළිබඳව දැනුම් දිය යුතුයි. ඉන් පසු විවාහ වන දවසේදී ඔවුන්ව ලියාපදිංචි කළ යුතුයි.

විවාහය ලියා පදිංචි කිරීමට සභාවයට බලය තිබේ නම් ඉහත සදහන් ආකාරයට ක්‍රියාකර ලියාපදිංචි කාර්යාලයෙන් නිකුත් කරන්නා වූ "රෝස පැහැති පෝරමය'' සභාපාලකතුමාට භාර දිය යුතුයි. ඉන් පසුවයි. එම විවාහය සිදු කිරීමට එය ලබා ගෙන සභාපාලකතුමාට බලය ලැබෙන්නේය.

35 පිටුව

- මේ දෙදෙනාගෙන් කවුරුන් හෝ මීට පෙර විවාහ වී සිටිනවාද කියා දැන ගැනීමට සභාපාලකතුමා ඔවුන් සමඟ සාකච්ඡා කළ යුතුයි.
- විවාහ වන්නා වූ දෙදෙනක් එක සභාවෙන් සිටියහොත් ඒ සභාවේදීද, වෙන සභාවක සිටිය හොත් ඒ සභාවේදී ද ඉරු දින 3 ක්ම විවාහය ගැන දැනුම් දිය යුතුය. මෙසේ දැනුම් දුන්නා කියා අතික් සභාවේ සභාපාලකයා ලිපියකින් දැනුම් නුදුනහොත් මේ විවාහය සිදු කිරීමට සභාපාලකයා ඉදිරිපත් නොවිය යුතුය.

**සභාවට විවාහය ගැන දැනුම් දෙන්නා වූ ක්‍රමය**

මේ ප්‍රදේශයෙන් සිටින්නා වූ (නම) සහ (තාලයාගේ මේ ප්‍රදේශයේ සිටින්නා වූ (මනාලියගේ නම) මේ දෙදෙනා විවාහ වීමට බලාපොරොත්තුව සිටින බව දැනුම් දෙමි. මේ දෙදෙනාට ශුද්ධ වූ විවාහයකට ඇතුළත් වීමට බැරි හේතුවක් නැතහොත් බාධාවක් තිබෙනවා කියා ඔබලාගෙත් කවුරුත් හෝ දැනගෙන සිටිනවානම් ඒබ ව දැනුම් දෙන්න.

** (1,2,3) දැන්වීම

**ආ) විවාහ දේව මෙහෙයේදී අසුන් වෙන්නාවූ ක්‍රමය**

සභාවේදී විවාහ දේව මෙහෙය පවත්වනවිට සාමාන්‍යයෙන් වාඩිවීමට මේ ක්‍රමය අනුගමනය කරනු ලබයි. දේශනා කූඩුවට ඉදිරි පිටත් වම් පැත්තේ තබා තිබෙන අසුන්වල මනාලියගේ නෑදෑයින්ට වෙත් කර යුතුය. දකුණු පැත්තේ ඇති පේලි මනාලයාගේ දෑයන් වෙනුවෙන් වෙන් කළ යුතුය. ඉතිරි වී ඇති පේළි කැදවීම අනුව පැමිණ සිටින ඕනෑම කෙනෙකුට වාඩි වීමට පුළුවන. දේව මෙහෙය පටන් ගැනීමට පෙර මනාලයාගේ මවට ඉදිරියට කැදවා දකුණු පැත්තේ වාඩි වීමට දෙන්න. ඉන්පසුව මනාලියගේ මව ඉදිරියට කැදවා ඇයට වම් පැත්තේ හිද ගැනීමට දෙන්න. මේ ක්‍රමය එක් එක් ප්‍රදේශයන් වලදී වෙනස් වේ.

36 පිටුව

**විවාහ පෙරහැර**

මනාලියගේ මව වාඩිවීම දේව මෙහෙය පටත් ගැනීමට සලකුණක් වේ. පටන් ගැන්මේදී මග පෙන්වීම දෙත්තා වූ අය(සිටියහොත් පමණි) එක්කෙනෙක් පිටුපස එක් කෙනෙක් හෝ දෙන්නෙක් බැගින් ඉදිරියට එන්න. ඉන් පසු මනාලියගේ යෙහෙලියන් පැමිණේ. (සිටියහොත් පමණ මනාලියගේ යෙහලියන් පිටුපස මල් කුමරිය හෝ මල් කුමරයත් පැමිණේ. ඔවුන් පිටුපසින් මුදු රැගෙත එන්නා පැමිණේ. (සිටියහොත්) මේ සියල්ලට පසු වැදගත් තැනැත්තිය වන මනාලිය තමාගේ පියා සහෝදරයත් ඉතා කිට්ටු පිරිමි නන කෙනෙක්/ දකුණු අත අල්ලාගෙන පැමිණිය යුතුයි.

මනාලිය පැමිණෙන්නා වූ පෙරහැර පටන් ගැනීමට පෙර සභාපාලකයා සහ මනාලයා ඔහුගේ යහළුවන් පැත්තෙන් තිබෙන දොරටුවකින් පැමිණිය යුතුයි. විවාහ පෙරහැර පටන්ගන්නා වේලාවේදී ඔවුන් දේශනා කුඩුව ඉදිරිපස සිට ගෙන පෙරහැර පැමිණෙන පැත්ත බලා ගෙන සිටී.

දකුණු පැත්තේදී මනාලයාද, වර්ෂ පැත්තේ මනාලියද සිටගෙන සිටින විට සභාපාලකයා කිව යුතු දේ. මේ මොහොතේදී සභාවේ අයද සිටගෙන සිටිය යුතුය.

ප්‍රිය සහෝදර, සහෝදරිය, දෙවියන් වහන්සේගේ සහ මෙම සභාවේ ඉදිරි පිට අද දින අපි රැස්ව සිටින්නේ ශුද්ධ වූ පාවුල්තුමා ආඥා කර ඇති පරිදි සියළු මනුෂ්‍යයන් විසින් ගරු කළ යුතු ශුද්ධ වූ විවාහ බන්ධනය තුළ මේ පුරුෂයාත්, මේ ස්ත්‍රියත්, එක් කිරීමටය. එම නිසා අනුශාසනාවක් නොමැතිව හෝ නොසැලකිලිමත් ලෙස නොව දේව භයෙන් යුතුව තේරුම් ඇතිව ගෞරවනීය ලෙස එසේ කළ යුතුය. මෙවැනි ශුද්ධ වූ බන්ධනයක් තුළ එක්වීමට මේ පුරුෂයාද මේ ස්ත්‍රියද දැන් පැමිණ සිටී. නීත්‍යානුකූල ලෙස මොවුන් දෙදෙනා එක් නොකිරීමට සාධාරණ හේතූන් යම් කෙනෙකුට ඇත්තනම් ඒවා දැන් පැවසිය යුතුය. නැතහොත් ඔහු මෙතැනින් සදාකාලයටම නිශ්ශබ්දව සිටීවා(තත්පර කිහිපයක් නිශ්ශබ්දව සිටියාට පසු විවාහ වීමට යන දෙදෙනා දෙස බලා සභාපාලකයා කිව යුතු දේදෝ

37 පිටුව

දෙවියන් වහන්සේගේ වචනයට අදාළව එකතු නොකළා වූ දෙදෙදෙනෙක් දෙවියන් වහන්සේ එක් නොකළ අය හැටියටත්, ඔවුන්ගේ විවාහය නිසාම විවාහයක් නොවන හැටියටත්, ඔබලා දෙදෙනා දැනගත යුතුය. ඒ නිසා සියළු රහස් හදවයතන් එළිදරව් වන්නා වූ භයානක දවසේදී ඔබ දෙදෙනාට පිළිතුරු දීමට සිදුවන නිසා ඔබ දෙදෙදෙනාට නීත්‍යානුකූලව විවාහ වීමට නොහැකි යම් කරුණක් ඔබ දෙදෙනාගෙන් කවුරුන් හෝ දැන ගෙන සිටී නම් එය දැන් ඉදිරිපත් කරන්න කියා මම ඔබ දෙදෙනාට අණ කරමි. (බාධා තිබෙනවා කියා ඒවා ඉදිරිපත් නොකළහොත් සභාපාලකයා පුරුෂයා දෙස බලා කිවයුතු දේ)

.......................................(පුරුෂයාගේ සම්පූරණ නම) ශුද්ධ වූ විවාහ බන්ධනය තුල දෙවියන් වහන්සේගේ නියමයන්ට අනුකූලව එකට ජීවත්වන පිණිස ඔබ මේ ස්ත්‍රියව තමාගේ විවාහක භාර්යාව ලෙස භාරගෙන ඔබ දෙදෙනා ජීවත් වෙනතුරු අත් සියලූ දෙනා ප්‍රතික්ෂේප කරමින්, රෝගයේදීත්, නිරෝගයේදීත්, ඇයට ප්‍රේමකර ඇයව සනසා ඇයට ගෞරවය කර ඔබ ඇයව පමණක් තබා ගත්තෙහිද?

මනමාලයා : ඔව්. මම කරයි. ඉන් පසු සභාපාලකයා මනාලිය අමතා මෙසේ කිව යුතුයි.

.....................................(ස්ත්‍රියගේ සම්පූර්ණ නම) ශුද්ධ වූ විවාහ බන්ධනය තුල දෙවියන් වහන්සේගේ නියමයන්ට අනුකූලව එකට ජීවත්වන පිණිස ඔබ මේ පුරුෂයාව තමාගේ විවාහක පුරුෂයා ලෙස භාරගෙන . දෙදෙනා ජීවත් වෙනතුරු අන් සියලු දෙනා ප්‍රතික්ෂේප කරමින්, රෝගයේදීත්, නිරෝගයේදීත්, ඔහුට ප්‍රේමකර ඔහුව සනසා ඔහුට ගෞරව කර ඔබ පමණක් ඔහුව තබා ගන්නෙහිද? පිනාලිය : ඔව්, මම කරමි.

**ඉන් පසු සභාපාලකයා පියා දෙස බලා කිව යුතු දේ**

මෙම පුරුෂයා සමග විවාහ වන පිණිස මෙම ස්ත්‍රියට අවසර දෙන්නේ කවුරුන්ද? පියා : මම වමි.

38 පිටුව

(ඉන්පසු සභාපාලකයා ස්ත්‍රියගේ පියා හෝ කිට්ටු ඥාතියාගේ අතින් ඇයව පිළිගෙන පුරුෂයා තමාගේ දකුණු අතෙන් ස්ත්‍රියගේ දකුණු අත අල්ලා ගත් විට සභාපාලකයා මෙසේ කියන ලෙස ඔවුන්ට දැන්විය යුතුය)

ශුද්ධ වූ විවාහ බන්ධනය තුල දෙවියන් වහන්සේගේ නියමයන්ට අනුකූලව එකට පිටත්වත පිණිස ඔබ මේ ස්ත්‍රියව තමාගේ විවාහක භාර්යාව ලෙස භාරගෙන ඔබ දෙදෙනා ජීවත් වෙනතුරු අත් සියලු දෙනා ප්‍රතික්ෂේප කරමින්, රෝගයේදීත්, නිරෝගයේදීත්, ඇයට ප්‍රේමකර ඇයව සතසා ඇයට ගෞරවය කර ඔබ ඇයව පමණක් තබා ගන්නෙහිද?

.............................. (පුරුෂයාගේ නම) වන මම.......................(ස්ත්‍රියගේ නම්) වන ඔබව මාගේ විවාහක භාර්යාව ලෙස පිළිගත අද දින සිට යහපතේද, අයහපතේද, පොහොසත්ව සිටින විටදීද, රෝගයේදීද, නිරෝගයේදීද, මරණය අප දෙදෙනා වෙන් කරන තුරු, දෙවියන් වහන්සේගේ නියමයන්ට අනුව ඔබට ප්‍රේමකර ඔබව ආරක්ෂා කිරීමට පොරොන්දු වෙමි.

ඉන්පසු ඔවුන් දෙදෙනාගේ අත් පහත දමන්නට සලස්වා නැවතත් ස්ත්‍රිය තමාගේ දකුණු අතින් පුරුෂයාගේ අත අල්ලාගෙන කිව යුතු දේ.

..............................(ස්ත්‍රියගේ නම වන ම..........................(පුරුෂයාගේ තමා වන ඔබව මාගේ විවාහක භාර්යාව ලෙස පිලිංගන අද දින සිට යහපතේද, අයහපතේද, පොහොසත්ව සිටින විටදීද, දුප්පත්ව සිටින විටදීද, රෝගයේදීද, නිරෝගයේදීද මරණය අප දෙදෙනා වෙන් කරන තුරු, දෙවියන් වහන්සේගේ නියමයන්ට අනුව ඔබට ප්‍රේමකර ඔබව සතසා ඔබට රක්ෂා කර ඔබට කීකරුවීමට මම පොරොන්දු වෙමි.

ඉන්පසු ඔවුන්ගේ අත් ඉවතට ගත් පසු සභාපාලකයා මුද්ද හෝ තැල්ල රැගෙන ස්ත්‍රියට පලදවන පිණිස පුරුෂයාට දිය යුතුය.

39 පිටුව

මුදු මාරු කරනවා නම් පුරුෂයා ස්ත්‍රියගේ වම් අතේ 4 වෙනි ඇගිල්ලටත්, ස්ත්‍රිය පුරුෂයාගේ වම් අතේ 4 වන ඇඟිල්ලටත් දැමිය යුතුයි.

**මුදු මාරු කරන විට දෙදෙනා කිව යුතු දේ**

මේ මුද්දෙන් තැල්ලෙන් ඔබව පළදවා ඔබ මාගේ වාහක භාර්යාව පුරුෂයා ලෙස සරණ පාවා ගෙන මා සතු සියළු වස්තුව දායාදයක් කොට පියාණන්ගෙන්ද, පුත්‍රයාණන්ගෙන්ද, ශුද්ධාත්මයාණන්ගේද නාමයෙන් මම ඔබට දායාදයක් කොට දෙමි. ආමෙන්.(මුදු මාරු කරන විට දෙදෙනාම මෙය කියවිය යුතු අතර තැල්ල පලදවන විට භාර්යාව එය නොකියවිය යුතුය.)

**ඉන්පසු සභාපාලකයා කිවයුතු දේ**

දෙවියන් වහන්සේ එක් කළ දෙය මනුෂ්‍යයා වෙන් නොකෙරෙත්වා! ..... (දෙදෙනාගේ නම් දෙසා යන දෙදෙනා ශුද්ධ වූ විවාහ බන්ධනය තුළ එකඟ වී ඒ බව මේ සභාව සහ දෙවියන් වහන්සේ ඉදිරියෙහි සාක්ෂි දරමින් එකිනෙකාට පොරොන්දු වී මුදු පැළඳවීමෙන්, මුදු ලබා ගැනීමෙන්ද, (තැල්ල පැලඳවීමේ) එකට අත් බැඳීමෙන්ද එම දේ ප්‍රකාශකර ඇති නිසා, සභාවෙන් සහ රජයෙන් මට පවරා ඇති බලය අනුව මොවුන් පුරුෂයාත්, භාර්යාවත්, ලෙස පියාගේද, පුත්‍රයාගේද, ශුද්ධාත්මයාණන්ගේද නාමෙන් ප්‍රකාශ කර සිටිමි. ආමේන්!

රාජ්‍යය අනුග්‍රහය ලබාගත් දේව සේවකයන් පමණක් රජ්‍යයත් යන වචනය භාවිතා කරන්න.

**දේව මෙහෙය වැඩ සටහන**

1. පිළිගැනීම
2. පටන් ගැනීමේ යාච්ඤාව
3. පළමු ගීතිකාව
4. බයිබලය කියවීම

40 පිටුව

5. සභාපාලකයා, මනාලියා සහ ඔහුගේ යහළුවන් පැමිණීම
6. මනාලිය පියා සමග පැමිණීම
7. අණ කිරීම (චෝදනා තිබේනම් ඉදිරිපත් කිරීමට)
8. දෙවන ගීතිකාව
9. දේශනාව
10. විවාහ පොරොන්දුව
11. මුදු මාරු කිරීම/තැල්ල පැළදවීම
12. තුන්වන ගීතිකාව
13. විවාහය ලියාපදිංචි කිරීම,
14. පුරුෂයා භාර්යාව ලෙස ප්‍රකාශ කිරීම
15. මාල යුවළ උදෙසා යාච්ඤා කිරීම (අත තබා)
16. මනාල යුවළ සභාවට හඳුන්වා දීම.
17. අවසන් යාව

සටහන : මෙම විවාහ දේව මෙහෙයේදී බයිබලය කියවන්නා වූ තැනැත්තා සමඟ සතර දෙනෙකුට වඩා වැඩියෙන් සහභාගී නොවිය යුතුය. දේශනාව, විවාහ පොරොන්දුව, මුදු මාරු කිරීම, යුවළ උදෙසා යාච්ඤා කිරීම, පුරුෂයා භාර්යාව ලෙස ප්‍රකාශ කිරීම, යුවල සභාවට හදුන්වා දීම යනාදී දේදී අනිවාර්යෙන්ම ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචි සභාවේ ආප ලත් දේවගැතිවරයෙකු විසින් කළ යුතුය.

ක්‍රියිස්ට් ගොස්පල් සභාව විශ්වාස කරන විශ්වාසයන්

1. ශු ලියවිලි(2 තිමොති 3:16-17)
2. සදාකාලික දේවත්වය (1 යොහාන් 5:7)
   දෙවියන්වහන්සේ ත්‍රිත්වය යන්නය. එනම්, පියාණන්වයන්සේ, පුත්‍රයාණන්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේ වනසේක.
3. මිනිසාගේ වැටීම(රෝම 5:12).
   මිනිසා දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවනු ලැබූ නමුත් මෙසේ සිය කැමැත්තෙන්ම අකීකරු වූ හෙයින් සර්ව සම්පූර්ණ ස්වභාවය නැති විය.
4. ගැළවීමේ සැලැස්ම (යොහාන් 3:16).
   අප පවුකරුවන් ලෙව සිටියදීම ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මරණයට පත් වූ එතුමා කෙරෙහි විශ්වාස කරන සියල්ලන්ට ගැළවීම සහතික කරදුන් බව අපි අදහමු.
5. දේව වරප්‍රසාද තුලින් ගැළවීම
   අප තුල ධර්මිෂ්ඨකමක් නැති බවත්, දෙවියන්වහන්සේ වෙත ලගාවිය යුත්තේ ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකමෙහි අනුග්‍රහයෙන් බවත් අප විශ්වාස කරමු.
6. මනස්තාපනය සහ පිළිගැනීම (1යොහන් 1:9)
   අවංක මනස්තාපනය ඇතිව ක්‍රිස්තුස්වහන්සේ සම්පූර්ණයෙන් පිළිගත් කළ අපි දෙවියන්වයන්සේ ඉදිරියේද පිළිගනු ලැබේ.
7. නව උපත(යොහන් 3:8)
   හැරීම කරණකොටගෙන සිත තුළද, ජීවතය තුළද, ඇතිවන් වෙනස ඇත්තෙන්ම සැබැ වෙනසක් බව අපි විශ්වාස කර්මු.
8. එදිනෙදා ක්‍රිස්තියාණි ජීවිතය (හේබ්‍රව් 6:1)

දිනෙන් දින ශුද්ධවීමක්, ඇදහිල්ල වැඩිදියුණුකර ගැනීමත්, දේව කැමැත්තට අනුකූල යැයි අපි විශ්වාස කරුමු.

9. බෞතිස්මය සහ ශුද්ධවූ සක්‍රමේන්තුව (මතෙව් 28:9/1 කොරින්ති 11:28)

බෞතිස්ම ස්නානය අභ්‍යන්තර ක්‍රියාවෙයක බාහිර සංකේතයක් යැයි අපි විශ්වාස කරුමු. රොටි සහ මිදියුෂ සංකේත වශයෙන් භාවිත කිරිමෙන් අන්තිම රාත්‍රි භෝජනය සිහිකළ යුතු යැයි අපි විශ්වාස කරමු.

10. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බෞතිස්මය (ක්‍රියා 2:4)

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බෞතිස්මය කරණකොටගෙන ඇදහිලිවන්තයාග් බලය ලැබෙන බවත්, මෙය බයිබලයේ සඩහන් අන්දමට සිදු වන් බවත් අපි විශ්වාස කරමු.

11. ආත්මයණන්වහන්සේගේ පූර්ණ ජීවිතය (ගලාති 5:16-25)
දිනපතා ම ආත්මයාණන් වහන්සේ කරනකොටගෙන හැසිරීම දේව කැමැත්තට අනුකූල යැයි අපි සිශ්වාස කරමු.

12. ආත්මයණන්වහන්සේගේ දීමනා සහ එල (1 කොරින්ති 12-1-11/ගලාති 5:22) කිතුණුවාට ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ලැබෙන බව අපි විශ්වාස කරමු. එසේම ආත්මයණන්වහන්සේගෙන් පූර්ණ ජීවිතයක් ආත්මීක එල මගින් පිළිඹිබු විය යුතුයි.

13. මධ්‍යස්තභාවය (පිලිප්පි 4:5) ඇදහිලිවන්තයාගේ එදිනෙදා ජීවිතය සහ අත්දැකීම් හේතුකොටගෙන ඇතිවිය හැකි සීමන්තික උද්‍යෝගයෙන් අපි වැලකිය යුතුයි.

14. දේව සුවය (යාකොබ් 5:14-16)

දේව සුවය යනු ඇදහිලිමත් යාච්ඥාවට පිළිතුරු වශයෙන් ක්‍රිස්තුස්වහන්සේගේ බලයෙන් රෝගාතුරයාට ලැබෙන සුවය වේ.

15. ක්‍රිස්තුස්වහන්සේගේ නැවත ඊම(1 තෙසලෝනික 4:16-17)
ක්‍රිස්තුස්වයන්සේගේ නැවත ඊම නුදුරු බවත්, උන්වහන්සේ පෞද්ගලීකව පැමිණෙන බවත්, අපි විශ්වාස කරමු.

16 සභාව සහ සම්බන්ධතා (ක්‍රියා 16:5) භෞතික සභාව සමග කටයුතු කිරීම අපගේ වැදගත් වගකීමක් යැයි අපි පිළිගනිමු.

17. සිවිල් ආණ්ඩුව(රෝම 19:5)
දේව කැමෙත්තට පටහැනි වන අවස්තාවන්හිටදී හැර සිවිල් පාලකයන්ට යටත්විය යුතුය.
18. අනිතීම විනිශ්චය (2 කොරින්ති 5:10)
යම් දිනෙක අපි සිහලු දෙනාම දෙවියන්වහන්සේගේ සිනිශ්චයාසනය ඉදිරියේ සිටින බවත්, එවිට සදාකාලික ජීවනය හෝ මරණය අතවන් බවත් අපි විශ්වාස කරමු.
19. සවර්ගය (1 කොරින්ති 2:9)
සවර්ගය යනු ඇදහිලිවන්තයන්ට හිමිව සදාකාලික නිවහන යැයි අපි විශ්වාස කරමු.
20. අපාය (එළිදරව් 20:10-15)
අපාය යනු ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරුවා ලෙස පිළිනොගන්නා වූ අය සදකලිකවම දුක් විදිනා ස්තානය යැයි අපි විශ්වාස කරමු.
21. ධර්මදූත මෙහෙවර (යාකොබ් 5:20)
ක්‍රිස්තියාණි සභාවේ වැදගත්ම කටයුත්ත වනුයේ, මිනිස් ආත්ම දෙවියන්වහන්සේ වෙතට හරවා ගැනීමය.
22. දසයෙන් කොටස සහ ස්ව කැමැත්ත අනුව දෙන පූජා, දෙවියන්වහන්සේගේ සුභාරංචිය තහවුරු කිරිමටත්, පැතිරීමටත්, දෙවියන්වහන්සේ විසින් නියම කර්න ලද ක්‍රමයන් වන්නේ දවයෙන් කොටස ගෙවීම සහ ස්ව කැමැත්ත අනුව පූජා ඔප්පු කිරීමය.
ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය යනුවෙන් දෙක්වෙන්නේ ලැළවුම්කරෙ වශයෙන් (රෝම 10:9) ශුද්ධාතමයෙන් බෞතිස්ම කරන්නා වශයෙන් (ලූක් 3:16) සුව කරන්නා වශයෙන් (1 පෙතෘ 2:24) සහ පැමිණෙන්ට සිටින රජු වශයෙන් ක්‍රිස්තුස්වහන්සේගේ සිව් ආකාර මෙහෙය වේ.
23. ක්‍රියිස්ට් ගොස්පෙල් සභාවේ මූල දර්ශනය
24. ක්‍රිස්තුස්වහන්සේ පොළොවට එනතෙක් මෙම දර්ශනහ සිදුවන බව
25. ක්‍රියිස්ට් ගොස්පල් දර්ශනය ලොව පුරා ව්‍යාප්ත වන් වග. සිහලු මහිමය ත්‍රී එක දෙවිදුට පමණක් වේ.

මෙම ග්‍රන්ථය සකස් කලේ ප්‍රධාන පාලක ක්‍රයිස්ට් ගොස්පල් සභාවේ සභාපති නිර්මාතෘ ගරු දේවගැති ඩබ්. ඒ. ඩී. කිංස්ලි වනිගසිංහ පූජකතුමා විසිනි.

## විශේෂ ස්තූතිය

මෙම ග්‍රන්ථය සැකසීමේදී සි චතුරස්‍ර සුභාරංචි සභාවේ ලබා ගත් දේව ධර්ම අධ්‍යාපනය හා ලබා ගත් ක්‍රිස්තියානි දේව සේවක විනය පොත සැකසීමට මහඟු පිටුවහලක් වූ හෙයින් සිව්චතුරස්‍ර සභා පවුලට හා ගරු දේවගැති ලෙස්ලි කීගල් පූජ්කතුමාටද නෙරංජන් පූජකතුමාට මාගේ ස්තූති හා ප්‍රණාමය මෙයින් පුද කර සිටිමි.

https://openl.io/translate/jpg/sinhalese